
Lineage
දාමය සවිමත් කිරීම
චර්යා ධර්ම සංග්‍රහය

# පෙළගැස්ම


හැඳින්වීම ........................ 3
දාමය සවිමත් කිරීම ........................ 5
අප සතුව චර්යා ධර්ම සංග්‍රහයක් තිබෙන්නේ ඇයි සහ එය භාවිත කරන්නේ කෙසේද? ........................ 5
චර්යා ධර්ම සංග්‍රහය යටතේ අප සතු වගකීම් ........................ 6
කළමනාකරුවන් සතු අමතර වගකීම් ........................ 6

අපගේ වටිනාකම් තුළ ජීවත් වන්න - හඬ අවදි කරන්න ........................ 7
අපගේ වටිනාකම් තුළ ජීවත් වීමට නම් අප හඬ අවදි කිරීම අවශ්‍ය වේ ........................ 8
හඬ අවදි කරන විට අපි Lineage වටිනාකම් තුළ දිවි ගෙවන්නෙමු ........................ 8
හඬ අවදි කළ යුත්තේ කවර මොහොතේදැයි දැන සිටීම ........................ 9
Speak Up සම්පත් ........................ 10
ප්‍රශ්නයක් අසන හෝ ගැටලුවක් වාර්තා කරන ආකාරය ........................ 10
ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව ........................ 10
අපගේ ‘විවෘත දොරටු’ ප්‍රතිපත්තිය ........................ 11
පළිගැනීම් වැළැක්වීමට අප දක්වන කැපවීම ........................ 11
ඔබ හඬ අවදි කරන විට කුමක් අපේක්ෂා කළ යුතු ද? ........................ 11

සේවාස්ථානය තුළ ගෞරවනීය හා වගකීම් සහගත ලෙස කටයුතු කිරීම ........................ 12
සුරක්ෂිත හා සෞඛ්‍යාරක්ෂිත සේවාස්ථානයක් ........................ 13
එකිනෙකාට ගරු කිරීම ........................ 14
විවිධත්වය, සමානත්වය හා අන්තර්ග්‍රාහීභාවය ........................ 15
මූල්‍ය හා ගිණුම්කරණ ප්‍රමිතීන් ........................ 16
ලේඛන කළමනාකරණය හා වාර්තා රඳවා ගැනීම ........................ 17
පිළිබැඳියා ගැටුම් ........................ 18
වත්කම් ආරක්ෂා කිරීම ........................ 19
රහස්‍ය හා හිමිකාර තොරතුරු හා බුද්ධිමය දේපළ ........................ 20
සේවාස්ථානය තුළ තාක්ෂණය භාවිත කිරීම ........................ 21
දත්ත ආරක්ෂාව, පෞද්ගලිකත්වය සහ පුද්ගලික තොරතුරු ........................ 22
සුපරීක්ෂාකාරී සන්නිවේදනය හා සමාජ මාධ්‍ය ........................ 23
නීති විරෝධී වෙළෙඳාම් ........................ 24

අපගේ පාරිභෝගිකයන් සහ පාර්ශ්වකරුවන් සමඟ ආචාර ධාර්මිකව කටයුතු කිරීම ........................ 25
ප්‍රතිභාරය සහ සාධාරණ තරගකාරීත්වය ........................ 26
දූෂණ හා අල්ලස් විරෝධය ........................ 27
ත්‍යාග, ආහාර පාන සහ ප්‍රවාහන පහසුකම් ........................ 28
වෙළෙඳ අනුකූලතාව ........................ 29
සැපයුම්කරුවන් සහ සමාගමේ නියෝජිතයන් ........................ 30
තුන්වැනි පාර්ශ්වයන්හි රහස්‍ය හා හිමිකාර තොරතුරු ........................ 31

අප වටා ඇති ප්‍රජාවන්ට සහාය දැක්වීම සහ මිහිතලය ආරක්ෂා කිරීම ........................ 32
දේශපාලනික ක්‍රියාකාරකම්, දේශපාලනික දායකත්වයන් සහ බලපෑම් කිරීම් ........................ 33
මිහිතලය ආරක්ෂා කිරීම ........................ 34
සමාජයීය බලපෑම ........................ 35
ප්‍රජා සේවාව සහ ප්‍රජා සත්කාර ලබා දීම ........................ 36

සාරාංශය ........................ 37

# හැඳින්වීම



"Lineage හි අප කවුරුන්ද යන්න නිර්වචනය කරන අපගේ වටිනාකම් ගෝලීය කණ්ඩායමක් වශයෙන් අප එකිනෙකා එකට සම්බන්ධ කරයි. අපගේ වටිනාකම්වලට අනුකූලව කටයුතු කිරීම මඟින් සමාගමක් ලෙස අපගේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අපට ඉඩකඩ ලැබේ — ආහාර අපතේ යාම වළක්වාලමින් ලෝකවාසීන් වෙත ආහාර ලබා දීමට උපකාරී විය හැකි පරිදි ආහාර සැපයුම් දාමය පරිවර්තනය කිරීමට එය ඉවහල් වේ.

උෂ්ණත්ව පාලිත නිපැයුම් දාමයේ සෑම භූමිකාවක්ම අතිශයින් වැදගත් වන අතර එකාබද්ධතාවෙන් යුතුව හා අපගේ වටිනාකම්වලට අනුව කටයුතු කිරීම තුළින් අපගේ ප්‍රජාවන්හි සහ සමස්ථ ලෝකයේ යහපත උදෙසා නිපැයුම් දාමය එක්ව සවිමත් කිරීමට අපට හැකියාව ලැබේ.

Lineage සමාගම තුළ කටයුතු කිරීමේදී අපගේ වටිනාකම් ඊට අදාළ වන්නේ කෙසේද යන්න ඔබ තුළට අනුගත කර ගනු පිණිස මෙම චර්යා ධර්ම සංග්‍රහය භාවිත කරන්න.

මෙම අති විශිෂ්ට කණ්ඩායම හේතුවෙන් Lineage සමාගම තවදුරටත් ශක්තිමත් වන බව කිව යුතු ය. මෙම කණ්ඩායම අපගේ වටිනාකම් තුළ ජීවත් වෙමින් දෛනික ව්‍යාපාරික කටයුතුවල යහපතට ඉවහල් වන වගකීම්සහගත තීරණ ගැනීමට දායක වීම පිළිබඳව මම කෘතඥ වෙමි. Lineage පවුලේ සාමාජිකයෙකු වීම පිළිබඳව ඔබට බෙහෙවින් ස්තුතියි."

**ග්‍රෙග් ලෙම්කල්,** ප්‍රධාන විධායක නිලධාරී



"අප එකිනෙකාගේ තනි හඬවල් සතුව සුවිසල් බලයක් ඇති බව අපගේ චර්යා ධර්ම සංග්‍රහය අපට සිහිපත් කරයි. Lineage සමාගම ආශ්‍රිතව ආචාර ධාර්මික ගැටලු ඉස්මතු වනු ඇතැයි අප අපේක්ෂා නොකළද, අපගේ සෑම ව්‍යාපාරික අංශයක්ම පුරාවට සියලුම ප්‍රශ්න හා ගැටලු සඳහා සහයෝගීව ප්‍රතිචාර දැක්වීමට අප සූදානමින් සිටින බව අපගේ කණ්ඩායම් සාමාජිකයන් විශ්වාස කරනු දැකීම අපගේ අපේක්ෂාවයි.

ඔබට කිසියම් ප්‍රශ්නයක් හෝ ගැටලුවක් තිබේ නම් ඒ පිළිබඳව හඬ අවදි කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. ප්‍රශ්නයක් මතු වූ විට සම්බන්ධ කර ගත යුත්තේ කවුරුන්ද යන්න දැන ගැනීමට මෙන්ම, යහපත් චේතනාවෙන් යුතුව ප්‍රශ්න හෝ ගැටලු මතු කරන කණ්ඩායම් සාමාජිකයන් සියලුම දෙනාට සමාගම සහයෝගය දක්වන බවට සිහිපත් කිරීමක් ලෙස ද මෙම චර්යා ධර්ම පද්ධතිය යොදා ගන්නා ලෙස සිහිපත් කරමු."

**නැතලි මැට්ස්ලර්,** ප්‍රධාන නීති නිලධාරී

# හැඳින්වීම




Lineage සමාගමේ අප විසින් ගනු ලැබෙන සෑම තීරණයක්ම මඟින් අපගේ ප්‍රජාවන් ඔස්සේ ආහාර ව්‍යාප්ත වන්නේ කෙසේද යන්න සහ ලොව පුරා ආහාර මේස වෙතට ළඟා වන්නේ කෙසේද යන්න කෙරෙහි බලපෑම් එල්ල වේ. මේ නිසා, නිවැරදි තීරණ ගැනීම අපගේ කණ්ඩායමේ සාර්ථකත්වයට බලපාන මූලික සාධකයකි. ඔබ කිසියම් ආචාර ධාර්මික ප්‍රශ්නයකට මුහුණ සිටී නම් හෝ කුමක් කළ යුතු ද යන්න නොදනී නම් ගත යුතු තීරණ පිළිබඳ මගපෙන්වීමක් ලබා ගැනීමට මෙම ආචාර ධර්ම සංග්‍රහය යොදා ගන්න. එමෙන්ම, ඔබේ කළමනාකරු හෝ වැඩ පරීක්ෂක සහ අපගේ මානව සම්පත් ව්‍යාපාරික හවුල්කරුවන් ඇතුළු Speak Up සම්පත් පුද්ගලයන් එකී ප්‍රශ්න හෝ ගැටලු විසඳා ගැනීමට සහාය වීමට සූදානමින් සිටී.

**ෂෝන් වැන්ඩරෙල්සන්**, ප්‍රධාන මානව සම්පත් නිලධාරී



අපගේ පාරිභෝගිකයන් අප කෙරෙහි විශ්වාසය තබන්නේ ආචාර ධාර්මික හා උපායමාර්ගික ව්‍යාපාරික හවුල්කරුවෙකු වශයෙන් ඔවුන්ගේ ගෞරවය දිනා ගැනීමට අප සමත් වී ඇති බැවිනි. උෂ්ණත්ව පාලිත නිපැයුම් දාමය සවිමත් කරනු සඳහා, අපගේ රැකියාවන් වගකීම්සහගතව ඉටු කරන ආකාරය මෙන්ම අපගේ කටයුතුවලට අදාළ වන නීති හා රෙගුලාසි වෙත අනුකූලතාව දැක්විය යුතු අයුරු අප විසින් අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ. ඔබ සතු පුද්ගලික වගකීම් සම්බන්ධයෙන් සෑම විටම පැහැදිලි අදහසකින් පසු වීමට මෙන්ම ඒවා අපගේ One Lineage කණ්ඩායමේ සමස්ථ මෙහෙයුම් වෙත බලපාන අයුරු අවබෝධ කර ගැනීමට හැකි වන පරිදි ඔබේ කටයුතු සඳහා මගපෙන්වීමක් ලබා ගැනීමට මෙම චර්යා ධර්ම සංග්‍රහය යොදා ගන්න.

**ජේෆ් රිවේරා**, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

# දාමය සවිමත් කිරීම

Lineage හි අප කවුරුන්ද යන්න අපගේ වටිනාකම් විසින් නිර්වචනය කරනු ලැබෙන අතර අප එකිනෙකා අපගේ රාජකාරීන් සමඟ සම්බන්ධ කරයි. අපගේ වටිනාකම්වලට අනුකූලව කටයුතු කිරීම මඟින් ආහාර අපතේ යාම වළකාවාලමින් ලෝකවාසීන්ගේ කුසගිනි නිවීමට දායක වීම අරමුණු කර ගත් ආහාර සැපයුම් දාමය පරිවර්තනය කිරීමේ අපගේ පරමාර්ථයට සහාය වීම තුළින් ලොව තුළ වෙනසක් උදා කිරීමට අපට අවකාශ සැලසේ. එමෙන්ම, වැඩ කිරීමට විශිෂ්ට සේවාස්ථානයක් බිහි කර ගැනීමට ද එය අපට උපකාරී වේ.

උෂ්ණත්ව පාලිත නිපැයුම් දාමය තුළ අප ඒ ඒ පුද්ගලයාගේ භූමිකාව ඊළඟ පුද්ගලයා තරමටම වැදගත් බවත්, අපගේ වටිනාකම් ගුරු කොට ගනිමින් ඒකාබද්ධතාවෙන් යුතුව කටයුතු කිරීම තුළින් අප සියලු දෙනා එක්ව මෙම දාමය සවිගත්වන බව වටහා ගනිමු.

## අප සතුව චර්යා ධර්ම සංග්‍රහයක් තිබෙන්නේ ඇයි සහ එය භාවිත කරන්නේ කෙසේද?

අපගේ චර්යා ධර්ම සංග්‍රහය අපගේ වටිනාකම් ක්‍රියාවන් බවට පරිවර්තනය කරයි. පවතින නීතියට අනුකූලව ව්‍යාපාරික කටයුතු පවත්වා ගැනීමට අදාළව අප සෑම දෙනාටම පැවරෙන වගකීම පිළිබඳ මගපෙන්වීමක් අපගේ ආචාර ධර්ම සංග්‍රහය මගින් සැපයේ. අප කටයුතු කරන පුද්ගලයන්ට මෙන්ම ආහාර සැපයුම් දාමයේ ඒකාග්‍රතාව ආරක්ෂා කිරීම උදෙසා අප ගනුදෙනු කරන ප්‍රජාවන්ට ගරු කිරීම එහි අරමුණයි.

උෂ්ණත්ව පාලිත නිපැයුම් දාමය සවිමත් කිරීම උදෙසා සෑම අයෙකුම සිය උපරිමයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ. ගෝලීය සමාගමක් වශයෙන් සංකීර්ණ නීති, රෙගුලාසි හා මහජන අපේක්ෂා මාලාවකට අභිමුඛ වීමට අපට සිදු වේ. අපගේ ව්‍යාපාරයේ ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ අපේක්ෂාවන් අවධාරණය කරන මෙම චර්යා ධර්ම සංග්‍රහය, නෛතික අවදානම් ඉස්මතු කිරීමට හෝ අපගේ ආයනතනික කීර්ති නාමයට හානි කිරීමට ඉඩ ඇති සිදුවීම් වළක්වා ගත හැකි පරිදි තීරණ ගැනීමට මගපෙන්වීමක් ලබා ගැනීමට අපට උපකාරී වේ. Lineage හි සමාගමික ප්‍රතිපත්ති අපගේ ආචාර ධාර්මික සංග්‍රහයට අනුකූල වන අතර ඇතැම් නිශ්චිත මාතෘකා සම්බන්ධයෙන් අතිරේක සුවිශේෂී තොරතුරු ලබා දේ. දේශීය නීතිය හා අපගේ චර්යා ධර්ම පද්ධතිය අතර ඝට්ටනයක් හෝ නොගැලපීමක් වේ නම් සහ ඔබට ඒ දෙකටම එක වර අනුකූලතාව දැක්වීමට නොහැකි නම් ඔබේ Speak Up සම්පත් පුද්ගලයන්ගේ උපදෙස් ලබා ගන්න.

**මෙම චර්යා ධර්ම සංග්‍රහයට පුරාවටම අප විසින් කාර්ය අවශ්‍යතා දෙකක් ඇතුළත් කරනු ලැබ ඇත: එකට සම්බන්ධ කිරීම සහ උෂ්ණත්වය පරීක්ෂා කිරීම.**

**එකට සම්බන්ධ කිරීම** යන්නෙන් අපගේ චර්යා ධර්ම පද්ධතියෙහි සාකච්ඡාවට බඳුන් කෙරෙන මාතෘකාවලට අදාළ කරුණු වැඩිදුරටත් විස්තර කෙරෙන අතර උපකාරී විය හැකි යැයි හැඟෙන අවස්ථාවලදී අවශ්‍ය අමතර තොරතුරු ලබා දේ. අප සතු දාමය සවිමත් කිරීමේ ඉලක්කය සඳහා, ඒකාබද්ධතාවෙන් යුතුව හා අපගේ චර්යා ධර්ම සංග්‍රහයට සහ වටිනාකම්වලට අනුකූලව අපගේ වගකීම් ඉටු කිරීමට හැකි පරිදි තීරණ ගැනීමේ හැකියාව අප සතුව ඇති බවට විශ්වාසයෙන් පසු වීමට අපට හැකි පරිදි සෑම මාතෘකාවක්ම සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

**උෂ්ණත්වය පරීක්ෂා කිරීම** යන්නෙන්, කිසියම් අවස්ථාවක් නිවැරදිද යන්න මැන ගැනීම උදෙසා සෑම මාතෘකාවකටම අදාළව අපගෙන්ම ඇසීමට ප්‍රශ්න **අප** වෙත ලබා දේ. දාමය සවිමත් කිරීම සඳහා අප සතු සහජ බුද්ධිය කෙරෙහි විශ්වාසය තබමින් අවශය අවස්ථාවලදී නිසි මගපෙන්වීම ලබා ගැනීම අවශ්‍ය වේ.

# ආචාර ධර්ම සංග්‍රහය යටතේ අප සතු වගකීම්

අපගේ චර්යා ධර්ම සංග්රහය අපි ව්‍යාපාර කරන සෑම තැනකම සිටින සියලුම නිලධාරීන් අධ්‍යක්ෂවරුන් සහ කණ්ඩායම්? සාම?ාජිකයින් වෙත අදාළ වේ. අපගේ සංග්රහයට අනුකූල වීමට අපොහොසත් වීමෙන් රැකියාව අවසන් කිරීම සහ සිවිල් සහ අපරාධ නඩු පැවරීම ඇතුළු විනය ක්රියාමාර්ගවලට හේතු විය හැකි ය

### කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- අපගේ ආචාර ධර්ම සංග්‍රහයද ඇතුළත්ව Lineage ප්‍රතිපත්ති, නීති හා රෙගුලාසි සියල්ලම අවබෝධ කර ගෙන නිසි අනුකූලතාව දැක්වීම.
- අපගේ චර්යා ධර්ම සංග්‍රහය, Lineage ප්‍රතිපත්ති හෝ වෙනත් නීති/රෙගුලාසි උල්ලංඝනය කරන්නේ යැයි ඔබ සාධාරණ ලෙස විශ්වාස කරන කවර හෝ චර්යාත්මක ගැටලුවක් වේ නම් ඒ බව අපගේ Speak Up සම්පත් පුද්ගලයන් වෙත වාර්තා කිරීම.
- සෑම වසරකදීම අපගේ චර්යා ධර්ම සංග්‍රහය සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ ඔබගේ අවබෝධය සනාථ කිරීම.


අප සමඟ හවුල්කාරත්වයන් ඇති කර ගන්නා හෝ අප වෙනුවෙන් ව්‍යාපාරික කටයුතුවල නිරත වන පුද්ගලයන් හා ආයතන සියල්ලම අපගේ වටිනාකම්වලට අනුකූලව සහ ඒකාබද්ධතාවෙන් යුතුව කටයුතු කිරීම වෙත අප දක්වන කැපවීමට අනුකූලව කටයුතු කරනු ඇතැයි ද අපි බලාපොරොත්තු වෙමු.

# කළමනාකරුවන්ට අදාළ අමතර වගකීම්

අපගේ වටිනාකම් සඳහා නායකත්වය ලබා දීම සහ ඒකාබද්ධතාවෙන් යුතුව කටයුතු කිරීම සඳහා Lineage සිය කළමනාකරුවන් සවිබල ගන්වයි. සුවිශේෂී බැඳීම් හා අමතර අපේක්ෂාවන් ද නායකත්වය හා සබැඳී තිබේ. කණ්ඩායම් සාමාජිකයන් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම දරන්නේ නම් ඔබ අපගේ වටිනාකම්වලට අනුකූලව ඒකාබද්ධතාවෙන් යුතුව හා අපගේ චර්යා ධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම සඳහා ඔබේ සහාය හිමි වන පුද්ගලයන් වෙත ප්‍රගාමී බලපෑමක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය වේ. ඊට අමතරව, ඔබ විසින් පහත අවශ්‍යතා සපුරාලිය යුතු වේ:

### කළමනාකරුවන් සතු වගකීම්:

- අන් අයට ආදර්ශයක් වීම සහ අපගේ චර්යා ධර්ම සංග්‍රහයට අනුගත වන හා මනා තීරණ ගැනීම්වලට හේතු වන ක්‍රියා සමඟින් නායකත්වය ලබා දීම.
- ආචාර ධර්ම සංග්‍රහය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, එය අපගේ ක්‍රියාකාරකම්වලට අදාළ වන ආකාරය පිළිබඳව ඔබගේ කණ්ඩායම් සාමාජිකයන් සමඟ සංවාදයේ යෙදීම සහ අපගේ Speak Up සම්පත් පුද්ගලයන් පිළිබඳව කතාබස් කිරීම තුළින් ප්‍රශ්න ඇසීමට හා ගැටලු ඉස්මතු කිරීමට සුරක්ෂිත හැඟීමක් ඔබගේ කණ්ඩායමේ සාමාජිකයන් තුළ ඇති කිරීම ඔස්සේ නිවැරදි කාර්ය රටාවක් ඇති කිරීම.
- ඒකාබද්ධතාව ඇසුරින් සාර්ථකත්වය ප්‍රකට කරන කණ්ඩායම් සාමාජිකයන් පිළිගැනීමට ලක් කිරීම උදෙසා 'වටිනාකම් පත්' යොදා ගැනීම තුළින් ජයග්‍රහණ සැමරීම.



මෙම ප්‍රතිපත්තිය සඳහා අත්හැරීමක් අත්‍යවශ්‍ය හෝ සුදුසු යැයි ඔබට හැඟේ නම්, ඔබට අත්හැරීමක් සඳහා ඉල්ලීමක් සහ ඉල්ලීම සඳහා හේතු Lineage හි ආයතනික අනුකූලතා සහ ආචාර ධර්ම කාර්යාලය ethics@onelineage.com හරහා ඉදිරිපත් කළ හැකි ය විධායක නිලධාරීන් සහ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ අධ්‍යක්ෂවරයකුගේ හෝ විධායක නිලධාරියකුගේ ආසන්නතම පවුලේ සාමාජිකයකු සඳහා මෙම ප්‍රතිපත්තියේ ඕනෑම අත්හැරීමක් සිදු කළ හැක්කේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පමණක් වන අතර, අත්හැරීම ලබා දීමට හේතු සමගින් Lineage හි කොටස් හිමියන් වෙත වහාම හෙළි කරනු ලැබේ.


අපගේ වටිනාකම් තුළ
ජීවත් වන්න - හඬ අවදි
කරන්න
දාමය සවිමත් කිරීම

# අපගේ වටිනාකම් තුළ ජීවත් වන්න - හඬ අවදි කරන්න

## අපගේ වටිනාකම් තුළ ජීවත් වීමට නම් ඔබේ හඬ අවදි කිරීම අවශ්‍ය වේ

අපගේ කණ්ඩායම් සාමාජිකයන් සිය හඬ අවදි කරනු දැකීම අපගේ අපේක්ෂාවයි - ප්‍රශ්න ඇසීම මෙන්ම කවර හෝ විෂමාචාරයක් හෝ සිදු විය හැකි දුරාචාරයක් පිළිබඳව ප්‍රශ්න මතු කිරීම ඉන් අදහස් වේ.

ඔබ හඬ අවදි කරන විට කටයුතු වඩා සාර්ථක කර ගැනීම සඳහා එය උපකාරී වේ — ඔබටත්, ඔබේ සහෝදර කණ්ඩායම් සාමාජිකයන්ටත්, සමස්ථයක් ලෙස Lienage සමාගමටත් එය උපකාරී වේ. හඬ අවදි කිරීමට අවස්ථාව සැලසීම Lineage සංස්කෘතිය පිළිබිඹු කරන සාධකයක් වන අතර, අවස්ථාවන් මනාව වටහා ගැනීම සහ ගැටලු විසඳීම සඳහා වන අපගේ ප්‍රවේශයට සහාය වීම තුළින් එය අපට අඛණ්ඩව වර්ධනය වීමට ඉඩකඩ විවර කරයි. එසේම, ඔබේ ගැටලු ආමන්ත්‍රණය කරමින් කල්තියාම ඒවා විසඳීමට මෙන්ම Lineage සමාගමට ඇති අවදානම් අඩු කිරීමටත් එය මහෝපකාරී වේ.



## හඬ අවදි කරන විට අපි □□□□□□□□ වටිනාකම් තුළ සජීවීව ජීවත් වෙමු

**සුරක්ෂිතතාව අපි හඬ නගන්නෙමු**, මන්ද, අප අපගේ මෙන්ම අන් අයගේ ද සුරක්ෂිතතාව වෙනුවෙන් වගකීම් දරන බැවිනි.

**විශ්වාසය අපි හඬ නගන්නෙමු** මන්ද, අපි සෑම අයෙකුගේම හඬට වටිනාකමක් ලබා දෙන භීතියෙන් තොර සේවා පරිසරයක් පවත්වා ගන්නා බැවිනි.

**ගෞරවය අපි හඬ නගන්නෙමු** මන්ද, අපි සෑම කණ්ඩායම් සාමාජිකයෙකුටම එකිනෙකා වෙනුවෙන් නැගී සිටීමට හැකි පරිදි වටිනාකමක් ලබා දෙන්නෙමු.

**නවෝත්පාදනය අපි හඬ නගන්නෙමු** මන්ද, අදහස් හා නිරීක්ෂණ බෙදාහදා ගැනීමෙන් අපට Lineage ඉදිරියට ගෙන යාමට අවස්ථාව උදා කෙරේ.

**ධෛර්යය අපි හඬ නගන්නෙමු** මන්ද, දුෂ්කර දේ කිරීම සෑම විටම පාහේ විශිෂ්ටතාව උදා කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකයක් වන බැවිනි.

**සේවක නායකත්වය අපි හඬ නගන්නෙමු** මන්ද, අපගේ වටිනාකම් සමගින් නායකත්වය ලබා දීමට හා ඒකාබද්ධතාවෙන් යුතුව කටයුතු කිරීමට වගකීමක් අප සතු බැවිනි.

### අපගේ #1 වටිනාකම සුරක්ෂිතතාවයි.

එමෙන්ම, එය අප කරන සෑම දෙයම අභිබවා යයි. අප වෙත ආහාර ලැබෙන, ඉවතට හරිනු ලැබෙන, ගබඩා කෙරෙන, ලබා ගන්නා සහ නැව්ගත කෙරෙන ආකාරයේ සිට, අප අපගේ රැකියාවන් ඉටු කර ආකාරය මෙන්ම සේවාස්ථානය තුළ දී අප එකිනෙකා කෙරෙහි අවධානය දක්වන ආකාරය දක්වාම සියලු පියවරවලදී ඒ කෙරෙහි අපි නිරතුරු අවධානය යොමු කරන්නෙමු. අවංකභාවය හා විනිවිදභාවය වැදගත් වන බවට සහ යහපත් චේතනාවෙන් අදහස්, ප්‍රශ්න හෝ ගැටලු ඉස්මතු කරමින් හඬ අවදි කිරීම පදනම් කර ගෙන කණ්ඩායම් සාමාජිකයන් හට දඬුවම් පැමිණවීමක් සිදු නොවන බවට වන අපගේ පොදු විශ්වාසය වෙත ද සුරක්ෂිතතා මූලධර්මය අදාළ වෙයි.

# හඬ නැගිය යුත්තේ කවර අවස්ථාවලදී ද යන්න දැන සිටීම

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්

කණ්ඩායම් සාමාජිකයින් අපගේ සංග්‍රහය, නීතිය, රීති හෝ රෙගුලාසිවල සැක සහිත හෝ සත්‍ය ලෙස උල්ලංඝනය කිරීම් Speak Up වෙත පැමිණිලි? කළ යුතු ය. පැමිණිලි? කළ යුතු අවස්ථා සඳහා පහත උදාහරණ ඇතුළත් වේ:


- හිංසනයට ලක් කිරීම් හෝ හිරිහැර, අවමන් කිරීම්
- අල්ලස් ගැනීම් හෝ අයුතු ලාභ සලසා දීම්
- නොමනා ත්‍යාග හෝ පාරිතෝෂික ලබා දීම්
- ප්‍රශ්නකාරී ගිණුම්කරණ හෝ විගණන කාරණා
- පිළිබැඳියා ගැටුම්
- ආහාර සුරක්ෂිතතාව ආශ්‍රිත ගැටලු
- රෙගුලාසි උල්ලංඝනය කිරීම්
- නීති විරෝධී වෙළෙඳ කටයුතු
- රහස්‍ය තොරතුරු හෙළිදරව් කිරීම්
- පාරිසරික, සෞඛ්‍ය හෝ සුරක්ෂිතතා ගැටලු
- සොරකම්
- මූල්‍ය අක්‍රමිකතා
- තරගකරුවන් සමඟ අනිසි සබඳතා පැවැත්වීම්

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම එක්ව හොඳින් සිටිමු

ඔබ කිසියම් දුෂ්කර තීරණයකට හෝ ආචාර ධාර්මික දුෂ්කරතාවකට මුහුණ පා සිටී නම්, සන්සුන් වීම පළමුව ඉතා වැදගත් ය — මඳ විරාමයක් ගෙන එකී අවස්ථාව සුපරීක්ෂාකාරීව සලකා බැලීම මින් අදහස් වේ. ඔබට ප්‍රශ්නයක් හෝ ගැටලුවක් තිබේ නම් — නොඑසේ නම් තත්ත්වය උත්සන්න වේ නම් — ඔබ සිටින තත්ත්වයේ උණුසුම පිරික්සා පහත ප්‍රශ්න සලකා බලන්න:

- මගේ ක්‍රියාවලින් අපගේ Lineage වටිනාකම් පිළිබිඹු වේ ද?
- මගේ ක්‍රියාවලින් මාගේ කණ්ඩායම් සාමාජිකයන්ගේ ශාරීරික හා මානසික සුරක්ෂිතතාව ප්‍රවර්ධනය වේ ද?
- කළ යුතු නිවැරදි දේ මෙය ද?
- මා විසින් අදාළ වැදගත් කරුණු සියල්ලම රැස් කර සමාලෝචනය කරනු ලැබ තිබේ ද?
- අපගේ පාරිභෝගිකයන්, හවුල්කරුවන්, ජනමාධ්‍ය හෝ ප්‍රජාව මාගේ ක්‍රියාවන් යහපත් ලෙස භාර ගනු ඇති ද?
- මෙම ක්‍රියාව නිසා Lineage කීර්ති නාමයට බලපෑමක් එල්ල වනු ඇති ද?
- මගේ සම-සේවකයන් හෝ පවුලේ සාමාජිකයන් මාගේ ක්‍රියාවන් ගැන දැනගතහොත් ඉන් මා අපහසුතාවට පත් වනු ඇති ද?
- මගේ ක්‍රියාවන් අපගේ චර්යා ධර්ම සංග්‍රහය හා ප්‍රතිපත්ති සහ නීතියට අනුකූල වන්නේ ද?

ඔබ කරන ක්‍රියාවන් හෝ ගන්නා තීරණ පිළිබඳ අවිනිශ්චිතතාවක් දැනේ නම් එකී ප්‍රශ්න හා ගැටලු පිළිබඳව සිතා බැලීම ප්‍රයෝජනවත් විය හැක. ඔබට ප්‍රශ්න මතු වූ හෝ මාර්ගෝපදේශන හෝ උපකාර අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක අපගේ Speak Up සම්පත් පුද්ගලයන් අමතන ලෙස අපි ඔබ දිරිමත් කරමු.



# □□□□□□ □□ සම්පත් පුද්ගලයන්

## ප්ශ්නයක් අසන හෝ ගැටලුවක් වාර්තා කරන ආකරය

ඔබට පුශ්න කිසිවක් ඇසීමට තිබේ නම් හෝ විෂමාචාරයක් හෝ සිදු විය හැකි දුරාචාරයක් පිළිබඳව වාර්තා කිරීමට අවශ්‍ය නම්, පහත දැක්වෙන ඕනෑම Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගන්න:

- **ඔබේ කළමනාකරු හෝ වැඩ පරීක්ෂක**
- **මානව සම්පත් කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු**
- **ආයතනික අනුකූලතා සහ ආචාර ධර්ම කණ්ඩායම (ethics@onelineage.com)**
- **Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව (onelineage.com/speakup)**

අපගේ Speak Up සම්පත් පුද්ගලයන් සමඟ සිදු කෙරෙන සන්නිවේදනයන් සියල්ලම දේශීය නීති සහ අදාළ වන අනෙකුත් දේශීය ප්‍රතිපත්තිවලට අනුකූලව හසුරුවනු ලැබේ (උදා:- අදාළ ඕනෑම දුක්ගැනවිල්ලක්, පැමිණිල්ලක් හෝ අදාළ වන නෛතික සීමාව තුළ විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තියක් ආදී).



## Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව

ප්‍රශ්න හෝ ගැටලු සම්බන්ධයෙන් ඔබගේ කළමනාකරු හෝ වැඩ පරීක්ෂක වෙත යොමු වීමේදී ඔබට පහසුදායී හැඟීමක් දැනීමට සැලැස්වීම අපගේ අවශ්‍යතාවයි. එසේම, ඔබ වෙනත් විකල්පයක් කරා යොමු වීමට කැමැත්තක් දක්වන අවස්ථා ද තිබිය හැකි බව අපි වටහා ගනිමු. විෂමාචාර හෝ සිදු විය හැකි කවර හෝ දුරාචාරයක් සම්බන්ධයෙන් ගැටලු වාර්තා කිරීමේදී හෝ ප්‍රශ්න මතු කිරීමේදී ඔබට සහාය වනු පිණිස අපි තුන්වැනි පාර්ශ්වයක් විසින් සත්කාරකත්වය ලබා දෙනු ලැබෙන Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව පිහිටුවීමු.

Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව සතියේ දින 7 පැය 24 පුරාවටම විවෘතව පවතින අතර එහිදී රහස්‍යභාවය සුරැකෙන අතර දේශීය නීති මඟින් අවසර ලැබෙන

අවස්ථාවලදී නිර්ණාමිකව ක්‍රියාත්මක වේ. පහත නාලිකා ඔස්සේ වාර්තා යොමු කළ හැක:

- **දුරකතනය ඔස්සේ:**
  ඕස්ට්‍රේලියාව - 1-800-768-120
  බෙල්ජියම - 0800-262-67
  කැනඩාව - 866-360-0008
  ඩෙන්මාර්කය - 80 25 42 15
  ප්‍රංශය - 0805-080039
  ජර්මනිය - 0800-183-0724
  ඉතාලිය - 800 743 075
  නෙදර්ලන්තය - 0800- 023-3064
  නවසීලන්තය - 0800 823 509
  නෝර්වේ - 800 62 472
  පෝලන්තය - 0-0-800-141-0023
  සිංගප්පූරුව - 8004922583
  දකුණු අප්‍රිකාව - 080 098 2093
  ශ්‍රී ලංකාව - 9-072-0987140
  ස්පාඤ්ඤය - 900-963267
  එක්සත් රාජධානිය - 0-808-189-0041
  ඇමරිකා එක්සත් ජනපදය -
  866-360-0008 (ඉංග්‍රීසි) හෝ
  800-216-1288 (එස්පැනෝල්)
  වියට්නාමය 120-32121

- **අන්තර්ජාලය හරහා:** අන්තර්ජාලය ඔස්සේ වාර්තාවක් යොමු කිරීමට පිවිසෙන්න www.lighthouse-services.com/lineagelogistics

- **විද්‍යුත් තැපැල ඔස්සේ:** ඔබේ සමාගමේ නම සඳහන් කොට reports@lighthouseservices.com, වෙත විද්‍යුත් තැපැල් පණිවිඩයක් එවන්න.

# අපගේ 'විවෘත දෙරටු' ප්‍රතිපත්තිය

සේවාස්ථානය තුළ මානසික සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීමට අප අනුගමනය කරන එක් ක්‍රමයක් වන්නේ පළිගැනීම්වලට ලක් වීමේ භීතියකින් තොරව අප සියලුම දෙනා හඬ නැගීමට දිරිමත් කරන සංස්කෘතියක් නිර්මාණය කිරීමයි. Lineage හි අපගේ විවෘත දොරටු ප්‍රතිපත්තිය සැලසුම් කර ඇත්තේ ප්‍රශ්න ඇසීම සහ ගැටලු ඉස්මතු කිරීම සම්බන්ධයෙන් පහසුදායී හැඟීමක් කණ්ඩායම් සාමාජිකයන් සියලුම දෙනාට හැඟෙන පරිසරයක් පෝෂණය කිරීම සඳහා ය.

### කළමනාකරුවන් සතු වගකීම

කළමනාකරුවන් පහත පියවර අනුගමනය කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු:

- විවෘතභාවය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම තුළින් සේවක නායකත්වය පිළිබඳ අපගේ වටිනාකම ප්රකට කිරීම
- සාමාජිකයන්ගේ ගැටලුවලට සවන් දීම
- සුදුසු විටදී ආයතනික අනුකූලතා සහ අචාර ධර්ම කාර්යාලය වෙත යොමු කරමින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රශ්න ඇසීම සහ ඒවාට නිසි පරිදි ප්‍රතිචාර දැක්වීම.

# පළිගැනීම් වැළැක්වීමට අප දක්වන කැපවීම

Lineage හි අප, අපගේ කණ්ඩායම් සාමාජිකයන් ප්රශ්න මතු කිරීම පදනම් කර ගෙන ඔවුන් කිසිදු ආකාරයක පළිගැනීමකට ලක් වන්නේ නම් එය කිසිදු ලෙසකින් නොඉවසන අතර ගැටලු මතු විය හැකි සිදු වීම් සම්බන්ධයෙන් යහපත් චේතනාවෙන් සිය හඬ අවදි කරන ඕනෑම අයෙකු හට සහාය දැක්වීමට අපි කැප වී සිටින්නෙමු. ප්රශ්නයක් ඉස්මතු කිරීම, සිදු විය හැකි විෂමාචාරයක් වාර්තා කිරීම හෝ විමර්ශන කටයුත්තක් සඳහා සහභාගී වීම හේතුවෙන් විධිමත් හෝ අවිධිමත් ස්වරූපයෙන් කිසිවෙකු වෙනස් කොට සලකනු ලැබෙන අවස්ථාවක පළිගැනීමක් සිදු වේ යැයි සැලකිය හැක. පළිගැනීම දේශීය නීතිය යටතේ නිර්වචනය කිරීමට සහ/හෝ තහනම් කිරීමට ද ඉඩ ඇත.

පළිගැනීමේ චර්යාවන්ට උදාහරණ මෙසේ ය:

- හඬ අවදි කිරීම පදනම් කර ගෙන තනතුරින් පහළ දැමීම, ස්ථාන මාරු ලබා දීම, අඩුවෙන් ගෙවීම් සිදු කිරීම හෝ ගුණාත්මකභාවයෙන් අඩු පැවරීම් සිදු කිරීම
- හඬ අවදි කිරීම පදනම් කර ගෙන රාජකාරී කටයුතු හා සබැඳි සමාජගතවීම්වලින් බැහැර කිරීම

හඬ අවදි කිරීම හෝ ගැටලුවක් ඉස්මතු කිරීම සඳහා ධෛර්යය අවශ්‍ය බව අප දන්නා බැවින් ඒ සඳහා අපි ඔබට සහාය වන්නෙමු. ඔබ හඬ අවදි කරන්නේ කෙසේද හෝ කවර අවස්ථාවේ ද යන්න කුමක් වුව ද ගෞරවනීය සැලකීමක් ඔබට බලාපොරොත්තු විය හැක. ප්‍රශ්න නඟන හෝ යහපත් චේතනාවෙන් ගැටලු මතු කරන හෝ විමර්ශන කටයුත්තකට සහභාගී වන කිසිදු කණ්ඩායම් සාමාජිකයෙකුට එරෙහි පළිගැනීම් සඳහා අපි කිසිදු ඉඩක් නොතබන්නෙමු. යහපත් චේතනාවෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම යන්නෙන් අදහස් වන්නේ ඔබ ලබා දෙන තොරතුරු අංගසම්පූර්ණ බව හා ඒවා සත්‍ය යැයි ඔබ විශ්වාස කරන බවයි. පළිගැනීමක් සිදු කරන ඕනෑම අයෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

හඬ අවදි කිරීම හේතුවෙන් අසාධාරණ ලෙස සැලකීමට බඳුන් වී ඇති බවක් ඔබට හැඟේ නම්, වහාම අපගේ Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගන්න.

# ඔබ හඬ අවදි කිරීමේදී කුමක් අපේක්ෂා කළ යුතු ද?

හඬ අවදි කිරීම අපගේ Lineage සංස්කෘතිය පිළිබිඹු කරන සාධකයක් වන අතර, අදාළ අවස්ථාව මනාව වටහා ගෙන ගැටලු විසඳීමේ අපේ ප්‍රවේශයට සහාය වීම තුළින් අඛණ්ඩව වර්ධනය වීමට අපට ඉන් ඉඩකඩ සැලසේ. ඔබ හඬ අවදි කරන්නේ කෙසේද හෝ කවර අවස්ථාවේ ද යන්න කුමක් වුව ද ගෞරවනීය සැලකීමක් ඔබට බලාපොරොත්තු විය හැක.

- අපි ඔබේ වාර්තාව බරපතල ලෙස සලකන්නෙමු.
- අපි සියලුම වාර්තා කඩිනමින්, ගැඹුරින් හා සාධාරණව විමර්ශනය කරන්නෙමු. කැඳවූ අවස්ථාවල එකී විමර්ශනයන්ට කණ්ඩායම් සාමාජිකයන් සහභාගී විය යුතු බව ද අපේක්ෂා කෙරේ.
- විමර්ශන කටයුතු අතරතුරදී මෙන්ම ඉන් පසුව ද රහස්‍යභාවය සුරැකීමට සාධාරණ ප්රයත්න අප විසින් දරනු ලැබෙන අතර ඵලදායී පරීක්ෂණයක් පැවැත්වීමට හෝ අදාළ නීති, රෙගුලාසි සහ නීතිමය ක්රියාමාර්ගව?ලට අනු?කූලව දැනගැනීමේ පදනම මත ඇතැම් සංවේදී තොරතුරු හෙළිදරව් කිරීම අවශ්ය විය හැකි ය.
- හඳුනා ගත් ගැටලු ආමන්ත්‍රණය කරනු වස් අපි සුදුසු පියවර ගන්නෙමු.
- හඬ අවදි කිරීම හේතුවෙන් ඔබ කිසියම් පළිගැනීමකට ලක් වන්නේ නම් අපි කිසිසේත්ම එය නොඉවසන්නෙමු.


සේවාස්ථානය තුළ
ගෞරවනීය හා වගකීම්
සහගත ලෙස කටයුතු
කිරීම
දාමය සවිමත් කිරීම

# සේවාස්ථානය තුළ ගෞරවනීය හා වගකීම් සහගත ලෙස කටයුතු කිරීම

## සුරක්ෂිත හා සෞඛ්‍යමත් සේවාස්ථානයක්

සුරක්ෂිතභාවය අපගේ #1 වටිනාකම වන අතර මීට ශාරීරික මෙන්ම මානසික සුරක්ෂිතභාවය ද ඇතුළත් වේ. Lineage හි අපි, සෑම අයෙකුම වෙනුවෙන් සුරක්ෂිත හා සෞඛ්‍යමත් සේවා පරිසරයක් ලබා දීමට ඇපකැප වී සිටින්නෙමු. සුරක්ෂිතභාවය පිළිබඳ අපගේ වටිනාකම වෘත්තීමය, පාරිසරික හා ආහාර සුරක්ෂිතතා සාධක වෙතද තවදුරටත් ව්‍යාප්ත වේ.

Lineage පරිශ්‍ර වෙත පිවිසෙන කණ්ඩායම් සාමාජිකයන්, අමුත්තන්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් පුද්ගලයන්, එකී පරිශ්‍ර, අප විසින් ගබඩා කරනු ලැබෙන ඉක්මනින් කල් ඉකුත් වන ආහාර නිපැයුම් සහ අපගේ පරිශ්‍රවලට ආසන්න පුද්ගලයන්, නිවාස හා ව්‍යාපාරවල සුරක්ෂිතතාව හා ආරක්ෂාව ප්‍රවර්ධනය කරන සෞඛ්‍ය, සුරක්ෂිතතා හා පාරිසරික අවශ්‍යතාවලට අනුකූලතාව දැක්වීම උදෙසා අප විසින් සුරක්ෂිතතා වැඩසටහන්, ප්‍රතිපත්ති, ක්‍රමවේද හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබ තිබේ.

### කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- ඔබගේ ලාංඡනය පැළඳීම හෝ කාර්යාලය අගුළු දැමීම වැනි සුරක්ෂිතතා ක්‍රමවේද සෑම විටම අනුගමනය කරන්න.
- ඔබට නිසි පුහුණුවක් ලබා දී ඇති කාර්යයන්හි පමණක් නිරත වන්න.
- කණ්ඩායම් සාමාජිකයෙකු හෝ සේවාස්ථානයේ වෙනත් ඕනෑම පුද්ගලයෙකු හෝ සැක කටයුතු චර්යාවක නිරත වන බව හැඟේ නම් ඔබේ හඬ අවදි කරන්න.
- වැඩ බිමෙහි ජෛව සුරක්ෂිතතාවට බාධා ඇති කරන ක්‍රියාකාරකම්වලින් වැළකී සිටින්න.
- අපගේ ගබඩා පරිශ්‍රයන්හි ඇති ආහාර දූෂ්‍ය වීමට බලපාන චේතාන්විත හෝ අචේතාන්විත ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා අවස්ථානුකූලව අවබෝධයෙන් සිටින්න.
- හදිසි අනුතුරු, තුවාල සිදු වීම් හෝ අනාරක්ෂිත තත්ත්ව කිසිවක් වේ නම් වහාම ඒ බව අපගේ Speak Up සම්පත් පුද්ගලයන් වෙත හෝ ඔබගේ සුරක්ෂිතතා අධීක්ෂක වෙත වාර්තා කරන්න.
- මත්පැන්, නීති විරෝධී මත්ද්‍රව්‍ය හෝ ආරක්ෂිත ලෙස නියම කර ඇති හෝ නියම කර ඇති ලෙස භාවිත කර නොමැති ඖෂධ ආදියෙන් වැළකී සේවයට වාර්තා කරන්න.

### එකට සම්බන්ධ කිරීම

#### සමාගමේ උත්සවවලදී මත්පැන් භාවිතය

Lineage සමාගමේ උත්සවවලදී මත්පැන් පිළිගන්වන අවස්ථා තිබිය හැක. මත්පැන් පරිභෝජනයට අවසර ලැබෙන සමාජයීය උත්සවයකට හෝ සම්මන්ත්‍රණයක් වැනි අවස්ථාවකට ඔබ සහභාගී වන්නේ නම්:

- Lineage සමාගම සහ අපගේ වටිනාකම් වගකීම්සහගතව නියෝජනය කරමින් ගෞරවනීය ලෙස හැසිරෙන්න.
- ඔබේ සුරක්ෂිතතාව හෝ අන් අයගේ සුරක්ෂිතතාවට බාධා වන අයුරින් කිසිදු අවස්ථාවක කටයුතු නොකරන්න
- සමාගමේ උත්සව අවස්ථාවක මත්පැන් ප්‍රතික්ෂේප කිරීමේ තීරණය ගැනීමේදී ස්වයං-විශ්වාසයෙන් කටයුතු කරන්න
- වෙනත් කණ්ඩායම් සාමාජිකයෙකුගේ සුරක්ෂිතතාව පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් ඔබට හැඟේ නම් අපගේ Speak Up සම්පත් පුද්ගලයන්ගේ සහාය පතන්න

### උෂ්ණත්වය පරීක්ෂා කිරීම

සුරක්ෂිත හා සෞඛ්‍යමත් සේවාස්ථානයක් නිර්මාණය කොට පවත්වා ගැනීම උදෙසා, අදහස්, ප්‍රශ්න, ගැටලු හෝ අත්වැරදීම් බෙදාහදා ගැනීම වෙනුවෙන් නොමනා සැලකීමකට අප ලක් නොවනු ඇත යන විශ්වාසය අප අතර පැවතීම අවශ්‍ය වේ. මානසික සුරක්ෂිතතාව යන සංකල්පය අප ඉගෙන ගන්නේ කෙසේද, අප එක්ව වැඩ කරන්නේ කෙසේද, අප ප්‍රශ්න අවසන්නේ කෙසේද, අප අදහස් ප්‍රකාශ කරන්නේ කෙසේද සහ අප එකිනෙකාට වටිනාකමක් දෙන්නේ හා සැලකීමට ලක් කරන්නේ කෙසේද යන කාරණාවලට අදාළ වේ.

#### ඔබගෙන්ම අසන්න:

- ප්‍රශ්න ඇසීමට පහසුදායී හැඟීමක් මට දැනේ ද?
- සිදු වන කිසියම් අත්වැරදීමක් වාර්තා කළ හොත් අන් අය මා පිළිබඳව සෘණාත්මක ආකල්පයක් දරනු ඇතැයි මට හැඟේ ද?
- මෙගේ මතයන් හා සංජානනයන් අන් අය හා බොදා ගතහොත් ඒවාට නිසි පිළිගැනීමක් නොලැබෙනු ඇති බවක් මට හැඟේ ද?
- සේවාස්ථානයේ රැස්වීම් හෝ සාකච්ඡාවලින් මා බැහැර කෙරෙන බවක් මට හැඟේ ද?
- ආයතනයේ ගැටලු හෙළිදරවු කිරීමෙන් මගේ රැකියාවට ගැටලු ඇති වේ යැයි බියක් මා තුළ පවතී ද?

මෙකී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සේවාස්ථානයේදී ඔබට මානසික සුරක්ෂිතභාවයක් දැනෙන බවට කදිම සංඥාවක් සපයන්නකි. ඉහත ප්‍රශ්න අතරින් කිසිවකට හෝ ඔබ දැක්විය යුතු ප්‍රතිචාරය සම්බන්ධයෙන් අවිනිශ්චිත හැඟීමක් ඔබට දැනේ නම් හෝ ඊට ඔබේ පිළිතුර 'ඔව්' යන්න නම්, ඔබට සවන් දීමට Lineage සමාගමට අවශ්‍යයි. සේවාස්ථානයේ ඔබේ අත්දැකීම වැඩිදියුණු කිරීමට අපට ඔබ හා කටයුතු කළ හැකි ආකාර සොයා ගැනීම සඳහා අපගේ Speak Up සම්පත් පුද්ගලයන් හා කතා කිරීම ගැන සලකා බලන්න.

# එකිනෙකාට ගරු කිරීම

ගරු කිරීම යනු Lineage හි අපගේ ප්‍රධාන වටිනාකම් අතරින් එකකි. ඒ අනුව, අප වැඩ කරන්නේ කවර ස්ථානයකද, කවර පුද්ගලයන් සමඟද යන්න කුමක් වුවද එකිනෙකාට ගෞරවනීය ලෙස සැලකීම අප සියලුම දෙනාගෙන් අපේක්ෂා කෙරේ. අන්‍යොන්‍ය ගෞරවය ප්‍රකට කරන විට අපි අප සියලුම දෙනාට සාඩම්බර විය හැකි සේවා සංස්කෘතියක් නිර්මාණය කරමින් කණ්ඩායමක් වශයෙන් වඩා හොඳින් වැඩ කරන්නෙමු. අපි කිසිදු විටෙකත් හිංසනය, පීඩා කිරීම්, අපහසුතාවයට පත් කිරීම්, බියට පත් කිරීම් හෝ වෙනස් කොට සැලකීම් නොඉවසන්නෙමු. අප එවැනි හැසිරීම් දකින්නේ අපගේ චර්යා ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම් වශයෙන් වන අතර බොහෝ අවස්ථාවලදී එය සාමාන්‍ය නීතිය උල්ලංඝනය කිරීමක් ද වේ.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- වෘත්තීයභාවයෙන් යුතුව හා ආචාර සම්පන්නව කටයුතු කරන්න. එසේම, කිසිදු විටෙක නොමනා සංවාද හෝ චර්යාවන්හි නියැළීමෙන් වළකින්න.
- වාර්ගිකත්වය, ආගම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව, ශාරීරික හෝ මානසික ආබාධිතතා, වයස හෝ කිසියම් පුද්ගලයෙකුට වැඩ කිරීමට ඇති ශක්‍යතාවට අදාළ නොවන අනෙකුත් සාධක සහ/හෝ නීතිය මඟින් ආරක්ෂා කර ඇති සාධක මත නොව පුද්ගලයෙකු සතු සුදුසුකම් සහ අත්දැකීම් මත පිහිටා රැකියාවට අදාළ තීරණ ගැනීමට වගබලා ගන්න.
- ඔබ නොමනා අයුරින් සැලකීමට ලක් වන්නේ නම් හෝ වෙනත් කිසිවෙකු එවන් තත්ත්වයකට මුහුණ පා ඇති බවක් ඔබට හැඟී යන්නේ නම් හඬ අවදි කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### හිංසනය සහ වෙනස් කොට සැලකීම

**හිංසනය යනු කුමක්ද?**
කිසිවෙකු කැමැත්තෙන් භාර නොගන්නා හෝ අනවශ්‍ය සහ අවලාදාත්මක, තැතිගැන්වීමට ලක් කරන හෝ අන් අය පීඩාවට ලක් කරන හා පහත ලක්ෂණ පදනම් කර ගත් ඕනෑම ආකාරයක භාෂාත්මක, දෘශ්‍යමය, වාචික හෝ කායික හැසිරීමක් 'හිංසනය' යන්නට ඇතුළත් වේ: ජනවාර්ගිකත්වය, සමෙහි වර්ණය, ජාතිකත්වය, ප්‍රවේණිය, ආගම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රකාශනය, වයස, ශාරීරික හෝ මානසික දුබලතා, විවාහක අවිවාහකභාවය, මිලිටරි හෝ වෘද්ධ ස්වභාවය, ගර්භණීභාවය, දරු උපත් ලබා දීම හෝ ඒ හා බැඳි තත්ත්වයන්, ජානගත තොරතුරු හෝ රාජ්‍ය හෝ ප්‍රාදේශීය නීති මඟින් ආරක්ෂා කර ඇති වෙනත් ඕනෑම ගතිලක්ෂණයක්. ලේඛනය, අන්තර්ජාල අවකාශයන්හි, කථිත/වාචික භාෂා භාවිතයන්, ශාරීරික හෝ දෘශ්‍යමය මාධ්‍යයන් යන ස්වරූපවලින් හිංසනය සිදු විය හැක.

**වෙනස් කොට සැලකීම යනු කුමක්ද?**
ඉහත සඳහන් කර ඇති සාධක ද ඇතුළත්ව නෛතිකව ආරක්ෂා කර ඇති ඇතැම් ගතිලක්ෂණ මත පදනම්ව කිසියම් පුද්ගලයෙකුට වෙනස් අයුරින් හෝ අසාධාරණ ලෙස සැලකීම 'වෙනස් කොට සැලකීම' යන්නෙන් අදහස් වන අතර යම් වයස් සීමාවක් පදනම් කර ගෙන කෙනෙකු රැකියාවකට බඳවා නොගැනීම ඊට නිදසුනකි.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

සේවාස්ථානයක් තුළ හිංසනය සහ වෙනස් කොට සැලකීම සිදු විය හැකි ආකාර රැසක් ඇත.

**ඔබෙන්ම අසන්න: "මා පහත දැක්වෙන අවස්ථා එකක් හෝ අත්විඳින්නේ ද?":**

- අභිමතයට පටහැනි ලිංගික අල්ලස්
- නොමනා විහිළු, අවලාදාත්මක අදහස් හෝ ඇණුම්පද
- වාචික තර්ජන හෝ සැඟවුණු තර්ජන
- ලිංගිකත්වය පාදක සහයෝගය දීම් සඳහා ඉල්ලීම් - විශේෂයෙන්ම තමන්ට වඩා ඉහළ තනතුරු දරන්නන්ගෙන්
- ඡායාරූප හෝ වෙනත් රූපික මාධ්‍ය ආශ්‍රිත දෘශ්‍යමය හිංසනයන්
- ආරක්ෂා කර ඇති ගතිලක්ෂණ මත පදනම්ව විශේෂිත වාසි ලබා දීමට පෙළඹීම්
- වාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය/ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව, ආගම, ආබාධිතතාව හෝ රැකියාවේ කාර්යසාධනයට අදාළ නොවන වෙනත් සමාන ගතිලක්ෂණ පදනම් කර ගෙන කෙනෙකු අපහසුතාවට ලක් කෙරෙන, දඬුවමට ලක් කෙරෙන හෝ වෙනස් කොට සලකනු ලැබෙන අවස්ථා.

ඉහත දක්වා ඇති අවස්ථාද ඇතුළුව කවර හෝ ආකාරයක හිංසනයක් හෝ වෙනස් කොට සැලකීමක් ඔබ අත්විඳින්නේ නම් හෝ එවැන්නක් ඔබේ අවධානයට ලක් වන්නේ නම් හෝ වහාම අපගේ Speak Up සම්පත් පුද්ගලයන් සම්බන්ධ කර ගන්න.

# විවිධත්වය, සමානත්වය හා අන්තර්ග්‍රාහීභාවය

සේවයට වාර්තා කරන සෑම දිනකම අවධානයට ලක් වීමටත්, සවන් දීමට ලක් වීමටත්, වටිනාකම් භුක්ති විඳීමටත් අයිතියක් අප සියලු දෙනාටම ඇත. විවිධ දෘෂ්ටිකෝණයන්, අත්දැකීම් සහ හැකියාවන් පිළිබිඹු කරන විවිධත්වයෙන් යුතු සේවාස්ථානයක් පවත්වා ගැනීම අපගේ විවිධත්වයෙන් යුතු පාරිභෝගික අවශ්‍යතා ඉටු කරමින් Lineage හි සාර්ථකත්වය පෙරමුණෙහි මෙහෙයවීමට අතිශයින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි.

අපගේ Lineage කණ්ඩායම සතු විවිධත්වය ගැන අපි මහත් අභිමානයෙන් පසු වන්නෙමු. එසේම, සෑම කණ්ඩායම් සාමාජිකයෙකු හටම මානසික වශයෙන් සුරක්ෂිතභාවයක් හැඟෙන අන්තර්ග්‍රාහී සේවාස්ථානයක් පවත්වා ගැනීම වෙනුවෙන් අප නිරතුරුවම ඇපකැප වී සිටින අතර, එය වනාහි තම අදහස්, ප්‍රශ්න, ගැටලු හෝ අත්වැරදීම් ඉස්මතු කරමින් යහපත් චේතනාවෙන් හඬ අවදි කරන කිසිදු සාමාජිකයෙකුට දඬුවම් නොපැමිණෙවන බවට වන පොදු විශ්වාසය පදනම් කර ගත්තකි.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- පුද්ගල පසුබිම්, මත සහ අත්දැකීම් ආශ්‍රිත විවිධත්වය අප ඉතා සවිමත් කණ්ඩායමක් බවට පත් කරන බව අගය කොට පිළිගැනීම.
- අන් අයට තමන්ව පිළිගැනීමට ලක් වන බවට හැඟෙන්නට සැලැස්වීම සහ කණ්ඩායම් සාමාජිකයන් කිසි විටෙකත් දෛනික සහ අර්ථාන්විත සේවාස්ථාන අන්තර්ක්‍රියා හෝ සංවාදවලින් හිතාමතාම බැහැර නොකිරීමට වගබලා ගැනීම.
- කිසිවෙකුට නොමනා ලෙස හෝ අගෞරවනීය ලෙස සලකනු ලැබෙන බවක් ඔබට හැඟෙන්නේ නම් ඒ ගැන හඬ අවදි කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### අපගේ විවිධත්වයේ, සමානත්වයේ සහ අන්තර්ග්‍රාහීත්වයේ 'සැබෑ උතුර'

Lineage හි අපි විවිධත්වය, සමානත්වය සහ අන්තර්ග්‍රාහීත්වය වෙනුවෙන් නිරතුරුව ඇපකැප වී සිටින අතර **අපගේ ව්‍යාපාරික අන්තර්ක්‍රියාවන් සියල්ලම තුළ දී අපගේ කණ්ඩායම් සාමාජිකයන්, පාරිභෝගිකයන් හා ප්‍රජා හවුල්කරුවන් සියලුම දෙනාට ගෞරවයෙන් සලකනු ලැබෙන බවත්, ඕනෑම පුද්ගලයෙකු හෝ කණ්ඩායමක පූර්ණ සහභාගීත්වය වළක්වාලන බාධක හඳුනා ගෙන ඒවා තුරන් කිරීමට අප නිරතුරුව කැප වී සිටින බවත් හැඟෙන්නට සලසන්වන බව ඉන් අදහස් වේ.**



## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

සෑම දිනකම අපගේ කණ්ඩායම් සාමාජිකයන්ට අප එකිනෙකා පිළිබඳව සැලකිල්ලෙන් පසු වන බව හා ඒ වෙනුවෙන් අප දක්වන දායකත්වයන් ප්‍රකට කළ හැකි සියුම් ආකාර තිබේ. අපට මෙවැනි ප්‍රශ්න අපෙන්ම ඇසිය හැක:

- **රැස්වීම්වලදී අනෙකුත් සාමාජිකයන්ගේ හඬ නිහඬ නොකොට ඔවුනටද හඬක් හිමි වන පරිදි සෑම මතයකටම මා සවන් දෙන්නේ ද?**
- **කිසියම් කණ්ඩායම් සාමාජිකයෙකු තමන් හඳුන්වන සර්වනාමය සඳහන් කළේ නම්, මා ඔවුන් ඇමතීමේදී හෝ හැඳින්වීමේදී එම නිවැරදි සර්වනාමය යොදා ගන්නේ ද? කණ්ඩායම් සාමාජිකයෙකු සඳහා යෙදෙන නිවැරදි සර්වනාමය කුමක්දැයි මා නොදන්නේ නම්, ඔවුන් භාවිත කරන සර්වනාමය කුමක්දැයි මා අසා තිබේ ද?**
- **රැස්වීම් සැලසුම් කිරීමේදී මා සෑම කණ්ඩායම් සාමාජිකයෙකුගේම කාර්ය සටහන සහ අදාළ කාල කලාපය සැලකිල්ලට ගෙන තිබේ ද?**
- **මගේ සහෝදර කණ්ඩායම් සාමාජිකයන් පිළිබඳව නිසි පරිදි නොදැන ඔවුන් ගැන ක්ෂණික හා කරුණු හරිහැටි නොදත් තීන්දුවලට එළඹීමෙන් වැළකීමට තරම් මා සුපරීක්ෂාකාරී ද?**

අප මෙවැනි ප්‍රශ්න අපගෙන්ම අසන විට හා අපගේ හැසිරීම අප වටා සිටින අයට කෙසේ බලපාන්නේද යන්න සලකා බැලීමට කාලය වෙන් කරන විට අපට සෑම අයෙකුටම තම සිතුවිලි බෙදාහදා ගැනීමට සුරක්ෂිත යැයි හැඟෙන පරිසරයක් පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

# මූල්‍ය හා ගිණුම්කරණ ප්‍රමිති

නීතියට අනුව අප අපගේ මූල්‍ය කටයුතු සාධාරණ ලෙස, නිසි කලට සහ නිවැරදි හා අංග සම්පූර්ණ අයුරින් වාර්තා කිරීම අවශ්‍ය වේ. අප විසින් අපට අදාළ වන සියලුම වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීම සහ අභ්‍යන්තර සහ බාහිර විගණනයන් සම්බන්ධයෙන් අවංක හා පැහැදිලිතාවයෙන් යුතුව වාර්තා කිරීම අවශ්‍ය වේ. මූල්‍ය වාර්තාකරණයේ ඒකාබද්ධතාව ප්‍රකට කිරීම තුළින් අපි අදාළ නෛතික බැඳීම් ඉටු කිරීමට පමණක් නොව ආයෝජකයන්, ණය දෙන ආයතන, නියාමන අධිකාරීන් සහ පොදු ජනතාව අතර විශ්වාසය දිනා ගත් සමාගමක් වශයෙන් අපට හිමි තත්ත්වය පවත්වා ගැනීමට ද සමත් වන්නෙමු.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- අභ්‍යන්තර හෝ බාහිර වුව ද කරුණු මත පදනම් වූ, නිවැරදි හා අංග සම්පූර්ණ ලේඛන, වාර්තා හා හෙළිදරවු කිරීම් සිදු කරන්න.
- සාවද්‍ය බවට ඔබ දන්නා හෝ කිසියම් අභ්‍යන්තර පාලන විධිවිධානයක් අභිබවා යන පිරිදි තොරතුරු රැස් කරන හෝ වාර්තා කරන ලෙස කිසිවෙකුට නියම නොකරන්න.
- Lineage හි සත්‍ය මෙහෙයුම් සම්බන්ධයෙන් කිසිවෙකු තුළ සාවද්‍ය මතයක් ඇති කිරීමේ අභිලාෂය සහිතව නිල වශයෙන් වාර්තා පොත්වල සඳහන් නොවන වාර්තා පවත්වා ගැනීම හෝ වෙනත් උපක්‍රමයක නියැළීම කිවසි විටෙකත් සිදු කිරීම, එවැන්නකට අවසර දීම හෝ එවැනි සිදු වීමකට සමාව දීම සිදු නොකරන්න.
- වාර්තා කිරීම ආශ්‍රිත කවර හෝ ගැටලුවක් තිබේ නම් ඒ බව Lineage හි අභ්‍යන්තර විගණකවරුන් හෝ ඔබේ කවර හෝ Speak Up සම්පත් මූලාශ්‍රයක් වෙත වාර්තා කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### මූල්‍ය වාර්තාකරණ දෝෂ හඳුනා ගැනීම

නිරවද්‍ය මූල්‍ය වාර්තාකරණය විශ්වසනීය සමාගමක් ලෙස පැවතීමේ අපගේ වටිනාකම හා බැඳී තිබේ - එසේම, මූල්‍ය දත්ත ආශ්‍රිතව කිසියම් දෝෂයක් ඔබ හඳුනා ගන්නේ නම් එ් පිළිබඳව හඬ නැගීම ධෛර්යමත් හා සවිමත් වීමේ අපගේ වටිනාකම සමග පෙරලා බැඳී තිබේ. කරුණු පාදකව මූල්‍ය දත්ත් ආශ්‍රිත දෝෂයක් ඔබ හඳුනා ගන්නේ නම් එය වහාම ඔබගේ Speak Up සම්පත් පුද්ගලයන් වෙත වාර්තා කිරීම වැදගත් වන අතර එවිට එම දෝෂය නිසි පරිදි හෙළිදරවු කිරීමට සහ/හෝ නිවැරදි කිරීමට හැකියාව ලැබේ.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

වංචාව අප සියලු දෙනාටම හානිකර දෙයකි — එසේම, එය ඒකාබද්ධතාවෙන් යුතුව කටයුතු කිරීමේ අපගේ පොදු කැපවීම සමඟ නොගැලපෙන්නකි. මේ නිසා, වංචාකාරී සිදුවීම්වලට අදාළ සංඥාවන් පිළිබඳව අප සියලු දෙනාම අවධානයෙන් පසු විය යුතු අතර ඒ පිළිබඳව ගැටලු මතු කළ යුත්තේ කවර මොහොතකදීද යන්න දැන සිටිය යුතු වේ.

### පහත ප්‍රශ්න ඔබෙන්ම අසන්න:

- කරුණු සාවද්‍ය ලෙස නිරූපණය කර තිබේ ද?
- තොරතුරු හෝ සාක්ෂි කිසිවක් සඟවා තිබේ ද?
- කරුණු සාවද්‍ය ලෙස නිරූපණය කිරීමට හෝ වංක ක්‍රියාවල නිරත වීමට කිසියම් බලපෑමක් එල්ල වී තිබේ ද?

මෙම කිසිදු ප්‍රශ්නයකට හෝ ඔබේ පිළිතුරු 'ඔව්' යන්න නම්, වහාම ඔබේ Speak Up සම්පත් පුද්ගලයෙකු හා සම්බන්ධ වන්න.



# ලේඛන කළමනාකරණය සහ වාර්තා රඳවා ගැනීම

අපි අපගේ දෛනික මෙහෙයුම්වල කොටසක් වශයෙන් ව්‍යාපාරික වාර්තා බිහි කිරීම, රඳවා ගැනීම සහ බැහැර කිරීම සිදු කරන්නෙමු. මනා ලේඛන කළමනාකරණ පිළිවෙත් පවත්වා ගැනීම නිසා අපගේ ව්‍යාපාරය සුමට හා කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීමට උපකාර ලැබෙන අතර අපගේ පාර්ශ්වකරුවන් සමඟ සුපැහැදිලිතාව හා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමට එය ඉවහල් වේ. අපගේ ප්‍රතිපත්ති සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව Lineage වාර්තා කළමනාකරණය කර ගැනීමේ වගකීම අප සියලු දෙනා වෙතම පැවරී තිබේ.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- සියලුම ව්‍යාපාරික වාර්තා බිහි කිරීමේදී නිවැරදි, අංග සම්පූර්ණ හා කාලීන වන්න - අපගේ මූල්‍ය හා ගිණුම්කරණ අවශ්‍යතාවන්ට අදාළ වන වාර්තා පමණක් නොව අනෙකුත් වාර්තාවලට ද අදාළව.
- සියලුම ව්‍යාපාරික වාර්තා, එකී වාර්තා කොතෙක් කල් රඳවා තබා ගත යුතු ද සහ ඒවා විනාශ කළ යුත්තේ කෙසේ ද යන්න විස්තර කෙරෙන Lineage ප්‍රතිපත්ති සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගන්න.
- අපගේ ලේඛන රඳවා ගැනීමේ ප්‍රතිපත්ති හා ක්‍රමවේද සම්බන්ධයෙන් ඔබට ගැටලු තිබේ නම් නීති දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

ඇතැම් ව්‍යාපාරික වාර්තා නෛතිකව අනිවාර්ය කර ඇති රඳවා ගැනීම් කාල සීමා හෝ ගිවිසුම්ගතව එකඟ වී ඇති රඳවා ගැනීම් කාල සීමාවලට යටත් වන අතර ඇතැම් අවස්ථාවලදී එකී කාල සීමා නොසලකමින් ව්‍යාපාරික වාර්තා රඳවා ගැනීමට Lineage සමාගම තීරණය කිරීමට ඉඩ ඇති බව සිහි තබා ගන්න.

### ඕනෑම ව්‍යාපාරික වාර්තාවක් විනාශ කිරීමට පෙර පහත ප්‍රශ්න ඔබෙන් අසන්න:

- මා විසින් අදාළ ලේඛන රඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කරනු ලැබ තිබේ ද සහ එකී වාර්තාව නිශ්චිත රඳවා ගැනීමේ කාල සීමාවකට යටත් වන්නේ ද යන්න තීරණය කරනු පිණිස සැලසුම් කර තිබේ ද?
- මෙම ව්‍යාපාරික වාර්තා රඳවා ඇති නෛතික වාර්තාවලට යටත් බවට මා වෙත දන්වා තිබේ ද?
- මෙකී ව්‍යාපාරික වාර්තාවලට අදාළව නියම කර ඇති නෛතික වාර්තාවක් තිබේ ද යන්න පිළිබඳව නිශ්චිත අදහසක් මට නොතිබේ ද?

ඉහත ප්‍රශ්නවලට ඔබේ පිළිතුර “ඔව්” යන්න නම්, එම වාර්තා විනාශ නොකරන්න. ඒ වෙනුවට, අදාළ ලේඛන රඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා කාර්ය සටහන සහ/හෝ නීති දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති විශේෂිත උපදෙස් පිළිපදින්න.

## එකට සම්බන්ධ කිරීම

### ව්‍යාපාරික වාර්තාවලට නිදසුන්

- කඩදාසි වාර්තාවල දෘඩ පිටපත්
- විද්‍යුත් තැපැල් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා
- වොයිස්මේල් පණිවිඩ
- ඡායාරූප

ව්‍යාපාරික වාර්තා නිසි පරිදි කළමනාකරණය කිරීම මඟින් අපගේ ව්‍යාපාරය සුමට හා ආරක්ෂිත ලෙස පවත්වා ගැනීමට සහාය ලැබේ.

# පිළිබැඳියා ගැටුම්

සමීපතම පවුලේ සාමාජික?යන්ගේ පෞද්ගලික අභිලාෂයන් ඇතුළුව ඔබේ පෞද්ගලික අභිලාෂයන් Lineage හි පිළිබැඳියාවන් සමඟ සට්ටනයකට? ලක් වන විට හෝ එවැන්නක්? සිදු? වන්?නට ඉඩ? ඇති බවක් පෙනෙන්නට ඇති විට පිළිබැඳියා ගැටුමක් ඇතැයි සලකනු ලැබේ.

Lineage සමාගම වෙනුවෙන් අප සතු වගකීම්වලට බලපාන හෝ අපගේ රාජකාරීන් වාස්තවිකව හා කාර්යක්ෂමව ඉටු කිරීමට ඇති හැකියාවට බලපෑම් ඇති කරන පිළිබැඳියා ගැටුම් හඳුනා ගැනීමට අපි සියලුම දෙනා කටයුතු කළ යුත්තෙමු.

සත්‍ය වශයෙන් සිදු වී ඇති හෝ සිදු වීමට ඉඩ ඇති පිළිබැඳියා ගැටුම් වැළැක්වීමට අපට සෑම විටම අවශ්‍යතාවක් තිබුණද සිදු විය හැකි එවැනි ගැටුම් විසඳා ගැනීම සඳහා කණ්ඩායම් සාමාජිකයන්ට හා සමාගමට එක්ව වැඩ කිරීමට හැක. පිළිබැඳියා ගැටුම් හෙළිදරව් කිරීමෙන් අදහස් වන්නේ Lineage හි අපගේ කටයුතුවලින් පරිබාහිරව අවස්ථා හඹා යාමට ඉඩක් අපට කිසිදු විටක නොමැති බවක් නොවේ. Lineage මෙන්ම එහි කණ්ඩායම් සාමාජිකයන් යන දෙපාර්ශ්වයේම යහපතට හේතු වන විසඳුම් සොයා ගැනීමට එය අපට ඉවහල් වේ.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- Lineage වෙනුවෙන් ඔබ ඉටු කරන කර්තව්‍යය හා සබැඳි තීන්දු හා කාර්යයන් ඔබේ සමාගමේ වටිනාකම් හා ඉලක්කවලට උපකාරී වන බව සනාථ කර ගන්න.
- අපක්ෂපාතීව කටයුතු කිරීමට ඔබට ඇති හැකියාවට කිසියම් ලෙසකින් බාධා පැමිණවෙන බවක් ඔබ සිතන්නේ නම්, ගත යුතු ඊළඟ පියවර සාකච්ඡා කිරීමට ඔබේ කළමනාකරු, වැඩ පරීක්ෂක හෝ වෙනත් Speak Up සම්පත් පුද්ගලයෙකු සමඟ කතාබස් කරන්න.
- කිසිදු විටෙකත් අනිසි පුද්ගලික ප්‍රතිලාභ ලබා ගැනීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම උදෙසා Lineage හි ඔබේ තනතුර භාවිත නොකරන්න.
- Lineage සමාගමට ප්‍රතිලාභ උදා කරන අවස්ථා පිළිබඳව මෙම සමාගම තුළ ඔබේ තනතුර හෝ Lineage දේපල හෝ තොරතුරු ඔබ භාවිත කිරීම ඔස්සේ දැන් ගත් විට එකී අවස්ථාවන්ගෙන් පුද්ගලික වාසි ලබා නොගන්න.
- ඔබ කිසියම් පිළිබැඳියා ගැටුමකට මුහුණ පා ඇත්නම් හෝ පිළිබැඳියා ගැටුමක් ඇති වනු ඇතැයි හැඟෙන්නේ නම් හෝ වෙනත් කණ්ඩායම් සාමාජිකයෙකුට පිළිබැඳියා ගැටුමක් තිබෙන බවට ඔබට ගැටලුවක් ඇත්නම් හෝ ඒ බව ආයතනික අනුකූලතා සහ ආචාර ධර්ම කාර්යාලය වෙත හෙළිදරවු කොට ඔබේ Speak Up සම්පත් පුද්ගලයන් සමඟ කතා කරන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

පිළිබැඳියා ගැටුමක් ඇගයීමට ලක් කිරීම දුෂ්කර කටයුත්තක් විය හැකි අතර එහිදී කරුණු කිහිපයක් සලකා බැලීමට සිදු විය හැක.

### පහත ප්‍රශ්න ඔබෙන්ම අසන්න:

- මෙම සබඳතාව නිසා Lineage සමාගමේ සේවය කිරීමට මට ඇති හැකියාවට බාධා ඇති වේද, නැතහොත් බාධා ඇති වීමට ඉඩක් ඇති බව පෙනී යයිද?
- මගේ බාහිර අභිලාෂ නිසා Lineage හි මගේ රාජකාරීන් වෙත බලපෑම් එල්ල වේද, එල්ල වීමට ඉඩ ඇති බව පෙනී යයි ද?

සෑම විටම මෙම ප්‍රශ්නවලට පිළිතුර “නැත” යන්න විය යුතු ය. Lineage හි සේවයේ නියුතු පුද්ගලයෙකු කිසියම් පිළිබැඳියා ගැටුමක් හෝ එවැන්නක් සිදු විය හැකි අවස්ථාවක් පිළිබඳව දැනුම්වත් වූ විට ඉක්මනින්ම අපට එය විසඳීමට එක්ව කටයුතු කළ හැක. කිසියම් පිළිබැඳියා ගැටුමක් සම්බන්ධයෙන් ඔබට ප්‍රශ්න තිබේ නම් නිසි මාර්ගෝපදේශන ලබා ගැනීම සඳහා ඔබගේ Speak Up සම්පත් පුද්ගලයෙකු හා සම්බන්ධ වන්න.

## එකට සම්බන්ධ කිරීම


### පිළිබැඳියා ගැටුම්වලට උදාහරණ

- Lineage සමාගමේ රැකියාවෙහි නිරතව සිටින අතරතුර තරගකාරී සමාගමක, තරගකාරී විය හැකි සමාගමක, සැපයුම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කාර සමාගමක කවර හෝ රැකියා ස්වභාවයක් දරමින් සේවකයෙකු ලෙස හෝ උපදේශකයෙකු ලෙස හෝ කටයුතු කිරීම
- තරගකරුවෙකු, සැපයුම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු විෂයෙහි සැලකිය යුතු තරමේ සෘජු හෝ වක්‍ර පිළිබැඳියාවක් තිබීම හෝ එවැන්නකට උරුමකම් කීම
- අපගේ ආචාර ධර්ම සංග්‍රහයේ විධිවිධානවලට අනුව අවසර ලැබෙන්නේ නම් මිස දැනට සිටින හෝ ඉදිරියේදී එක් වීමට ඉඩ ඇති පාරිභෝගිකයෙකු, තරගකරුවෙකු හෝ සැපයුම්කරුවෙකු වෙතින් ත්‍යාග, වට්ටම් හෝ සේවා භාර ගැනීම
- Lineage කණ්ඩායම් සාමාජිකයෙකුගේ දන්නා පවුල් සාමාජිකයෙකුට අයත් හෝ එවැන්නෙකු විසින් සේවයේ යොදවනු ලැබ ඇති වෙළෙන්දන්, සැපයුම්කරුවන් හෝ හවුල්කරුවන් සමඟ වැඩ කිරීම
- ඥාතී, සමීප සහකරුවෙකු හෝ සමීප පුද්ගලික මිත්‍රයෙකු සමඟ සෘජු හෝ වක්‍ර අධීක්ෂණ සබඳතා පැවැත්වීම හෝ එවැන්නෙකු සේවයට බඳවා ගැනීමේ හෝ තෝරා ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීම
- ඔබගේ තනතුර පුද්ගලික වාසි වෙනුවෙන් භාවිත කිරීම හෝ ඔබගේ රැකියා භූමිකාව තුළ අවබෝධ කර ගන්නා ලද ව්‍යාපාරික අවස්ථා ඔබගේ හෝ වෙනත් අයෙකුගේ ප්‍රතිලාභය වෙනුවෙන් යොදා ගැනීම (නීතිය සහ අදාළ Lineage ප්‍රතිපත්තිය මඟින් අවසර දී ඇත්නම් හැර)

# වත්කම් ආරක්ෂ කිරීම

අප Lineage වත්කම් හා අපගේ පාරිභෝගික වත්කම් වගකීම්සහගතව භාවිත කරන විට අපගේ ව්‍යාපාරය වඩා කාර්යක්ෂම හා සාර්ථක අයුරින් ක්‍රියාත්මක වෙයි. පහත කොටසෙහි සවිස්තරව සාකච්ඡා කෙරෙන භෞතික, මූල්‍ය හා තොරතුරු වත්කම් ද ඇතුළත් මෙකී වත්කම් ආරක්ෂා කිරීමේ වගකීම අප සියලු දෙනා වෙත පැවරේ.

වත්කම් අපරීක්ෂාකාරී, හානිකර, වංක, වංචාකාරී ලෙස හා අපතේ යන අයුරින් හැසිරවීම මඟින් අපගේ සාර්ථකත්වය කෙරෙහි සෘජු බලපෑමක් එල්ල වේ. අප අපගේ පුද්ගලික වත්කම් භාවිත කිරීමේදී අනුගමනය කරන සුපරීක්ෂාකාරීභාවයෙන් යුතුවම අපගේ සමාගමේ සහ පාරිභෝගිකයන්ගේ වත්කම්ද භාවිත කිරීම හා හැසිරවීම සිදු කළ යුතු වේ.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- සමාගමේ වත්කම් ඕනෑම ආකාරයකින් පුද්ගලික පරිහරණයට ගැනීම සීමිත හා සාධාරණ බවත් එය ඔබේ රැකියාවේ වගකීම්වලට බාධා ඇති නොකරන බවත් සහතික කරමින් සමාගමේ වත්කම් මූලික වශයෙන්ම ව්‍යාපාරික අරමුණු සඳහා පමණක් යොදා ගන්න.
- Lineage සමාගමට වියදම් දැරීමට සිදු වන පරිදි වත්කම් භාවිත කිරීමේදී නිසි තීරණ ගැනීම් ප්‍රකට කරමින් අදාළ අනුමැතීන් ලබා ගන්න.
- උපකරණ, අමුද්‍රව්‍ය හෝ නිෂ්පාදන වැනි පාරිභෝගික වත්කම් භාවිත කිරීමේදී, හැසිරවීමේදී සහ ලේඛනගත කිරීමේදී වගකීම්සහගතව කටයුතු කරන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

සමාගමේ සහ පාරිභෝගිකයන්ගේ වත්කම් වගකීම්සහගතව භාවිත කිරීම අපගේ දාමය සවිමත් කිරීමට අපට අවශ්‍ය වේ. ඔබ සමාගමේ සහ පාරිභෝගිකයන්ගේ වත්කම් භාවිත කරන විට — භෞතික, මූල්‍ය සහ තොරතුරු වත්කම් ඇතුළත්ව — පහත ප්‍රශ්න ඔබෙන් අසන්න:

- මා මේ සමාගමික වත්කම භාවිත කරන්නේ ඉන් අපේක්ෂිත අරමුණ සඳහා ද?
- අපගේ සමාගමේ සහ පාරිභෝගිකයන්ගේ වත්කම් අහිමි (පාඩු) වීම, අපතේ යාම සහ අපරීක්ෂාකාරී ලෙස භාවිතයට ලක් වීම හඳුනා ගන්නා සහ වළක්වා ගන්නා ආකාරය මා දන්නේ ද?
- Lineage සමාගම වෙනුවෙන් මා වියදම් ඇති කරන්නේ වගකීම්සහගත අයුරින් ද?
- මා පාරිභෝගික නිෂ්පාදන සංචලනය සහ ගබඩා කිරීම වගකීම්සහගත අයුරින් හැසිරවීම සහ ලේඛනගත කිරීම සිදු කරන්නේ ද?

සෑම විටම මෙම ප්‍රශ්නවලට පිළිතුර විය යුත්තේ “ඔව්” යන්නයි. Lineage හි අපි සියලුම දෙනා අපගේ සමාගමේ හා පාරිභෝගිකයන්ගේ වත්කම් සුරක්ෂිත ලෙස පවත්වා ගැනීමට එක්ව කටයුතු කළ යුත්තෙමු.

## එකට සම්බන්ධ කිරීම

### වත්කම් වර්ග

වත්කම්වලට සියලුම වර්ගවල සැපයුම්, පරිභෝජන භාණ්ඩ, උපකරණ, ගොඩනැගිලි, ලී බඩු, සවි කිරීම්, මෙවලම්, නිෂ්පාදන, අමුද්‍රව්‍ය සහ රථ වාහන ආදී භෞතික වත්කම් අයත් වේ. එමෙන්ම, අරමුදල් හා බිල්පත් ක්‍රියාවලීන් වැනි මූල්‍ය වත්කම්, අපගේ හිමිකාර හා රහස්‍ය තොරතුරු සහ Lineage සතු බුද්ධිමය දේපල වැනි තොරතුරු වත්කම් සහ තුන්වැනි පාර්ශ්වීය හවුල්කරුවන්, පාරිභෝගිකයන් හෝ සැපයුම්කරුවන් ආදිය ද වත්කම් අතරට ඇතුළත් වේ.

# රහස්‍ය හා හිමිකාර තොරතුරු සහ බුද්ධිමය දේපල

අපගේ ව්‍යාපාරයෙහි කොටසක් වශයෙන්, Lineage සමාගමට අදාළ රහස්‍ය හා හිමිකාර තොරතුරු වෙත ද අපට ප්‍රවේශය ඇත. ඉතාම වැදගත් සමාගමික වත්කමක් වන රහස්‍ය හා හිමිකාර තොරතුරු වනාහි අපගේ තරගකාරී වාසියට සෑම විටම අතිශය වැදගත් සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි කොටසක් වශයෙන්, අපගේ පාරිභෝගිකයන් මෙන්ම දැනටමත් අප හා එක් වී සිටින සහ අනාගත ව්‍යාපාරික හවුල්කරුවන්ට අදාළ රහස්‍ය හා හිමිකාර තොරතුරු වෙත ද අපට ප්‍රවේශය ඇත. මෙම තොරතුරු හඳුනා ගෙන ආරක්ෂා කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව අවබෝධයෙන් පසු වීම අප සියලුම දෙනාගේ වගකීමකි.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- රහස්‍ය හා හිමිකාර තොරතුරු Lineage සමාගමට අදාළ ඒවා වුවද, නැතහොත් ඒවා Lineage හි ඔබගේ රැකියාව අතරතුරදී ඉගෙන ගන්නා දේ වුවද (නිදසුනක් ලෙස කිසියම් පාරිභෝගිකයෙකු හෝ ව්‍යාපාරික හවුල්කරුවෙකු හරහා) එකී තොරතුරු ඉතා සුපරීක්ෂාකාරීව හසුරුවන්න.
- රහස්‍ය හා හිමිකාර තොරතුරු වෙත ප්‍රවේශ වීම හා භාවිත කිරීම හුදෙක්ම ඔබගේ රැකියාවට අවශ්‍ය වන තරමට පමණක් සිදු කරන්න.
- රහස්‍ය තොරතුරු පිළිබඳව සාකච්ඡා කිරීමේදී සහ ඒවා බෙදාහදා ගැනීමේදී සුපරීක්ෂාකාරී වන්න — එකී තොරතුරු ලැබීමට හෝ සමාලෝචනය කිරීමට අවසර නොලත් කිසිදු පුද්ගලයෙකු සමඟ ඒවා බෙදා නොගන්න.
- ඔබට ලිඛිත අවසරයක් ලැබී ඇත්නම් හැර Lineage සමාගමෙන් පරිබාහිර කිසිදු පුද්ගලයෙකු සමඟ රහස්‍ය හා හිමිකාර තොරතුරු කිසිවක් බෙදා නොගන්න. Lineage සමාගම තුළ පවා රහස්‍ය හා හිමිකාර තොරතුරු බෙදා ගැනීමේදී ඉතා විචක්ෂණශීලී වන්න (උදා:- "දැන ගැනීමට ඇති අවශ්‍යතාව" යන පදනම මත).

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

ඇතැම් අවස්ථාවලදී රහස්‍ය හා හිමිකාර තොරතුරු ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව 'රහසිගතයි' ලෙස මුද්‍රා තබා ඇති ලේඛන ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව තරමටම ප්‍රත්‍යක්ෂ නොවන අවස්ථා ඇත. අප සියුම් වෙනස්කම් වටහා ගැනීම ද මේ නිසා වැදගත් වේ. නිදසුනක් වශයෙන්, පහත ප්‍රශ්න ඔබෙන්ම අසන්න:

- **Lineage හි මගේ සේවා කාලය අවසන් වීමෙන් පසුව පවා, Lineage සමාගමේ සේවයේ නියුතු කාල සීමාව තුළ මට ප්‍රවේශය තිබුණු රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීමේ වගකීම මට පැවරෙන බව මා වටහා ගෙන සිටී ද?**
- **කිසියම් පුද්ගලයෙකු වැරදීමකින් රහස්‍ය තොරතුරක් මා වෙත එවන ලද්දේ නම් මා වහාම එය මකා දමා මගේ Speak Up සම්පත් පුද්ගලයා සම්බන්ධ කර ගෙන ඒ බව දැනුම් දිය යුතු බව මා තේරුම් ගෙන සිටී ද?**
- **රහස්‍ය තොරතුරු ආරක්ෂිතව පවත්වා ගැනීම සම්බන්ධයෙන් මා සමඟ එකට වැඩ කරන පුද්ගලයා මට විශ්වාස කළ හැකි වුවද, මට එම තොරතුරු — එම තොරතුරු ඔවුන්ට සිය රැකියා අවශ්‍යතා සඳහා සත්‍ය වශයෙන්ම දැන ගැනීමට අවශ්‍ය නම් මිස - බෙදා ගැනීමට නොහැකි බව මා දන්නේ ද?**

මෙම ප්‍රශ්නවලට පිළිතුර සෑම විටම "ඔව්" යන්න විය යුතු ය. කිසියම් තොරතුරක් රහස්‍ය වන්නේ ද යන්න් හෝ එය අන් අය හා බෙදාහදා ගැනීමට ඔබට හැකි ද යන්න පිළිබඳව ගැටලු තිබේ නම්, ඔබගේ හඬ නැගීමේ සම්පත් පුද්ගලයෙකු හා සම්බන්ධ වන්න

## එකට සම්බන්ධ කිරීම
### වැදගත් නිර්වචන

**රහස්‍ය තොරතුරු**
රහස්‍ය තොරතුරක් යනු, තවමත් පොදුවේ ප්‍රසිද්ධ කර නොමැති, අපගේ සමාගම හෝ අපගේ ව්‍යාපාරික හවුල්කරුවෙකු පිළිබඳ කිසියම් තොරතුරකි. ඒ සඳහා ඇතැම් උදාහරණ වශයෙන් අලෙවිකරණ සැලසුම්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ආශ්‍රිත වෙනස්කම්, පඩිපත්, පුද්ගලික වාර්තා හෝ මෙහෙයුම් හා අයවැය තොරතුරු ආදිය දැක්විය හැක. මෙම තොරතුරු විවිධ ස්වරූපවලින් පැවතිය හැකි අතර ලිඛිත, කථිත, නිරීක්ෂිත හෝ ඉලෙක්ට්‍රොනික වශයෙන් ගබඩා කර ඇති තොරතුරු ඊට ඇතුළත් වේ.

**හිමිකාර තොරතුරු**
හිමිකාර තොරතුරු යනු කිසියම් ව්‍යාපාරයක් තමන්ටම ආවේණිකව සිදු කරන හෝ බිහි කරන ඕනෑම දෙයකට අදාළ වන රහස්‍ය තොරතුරු වර්ගයකි. ෆෙඩරල් නෛතික ආරක්ෂණය සහිත පේටන්ට් බලපත්‍ර, හිමිකම් සහ වෙළෙඳ නාම මෙන්ම රහස්‍ය තොරතුරු, කාර්ය නිපුණතා හා වෙළෙඳ රහස් ආදී ආයතනික බුද්ධිමය දේපල ඊට ඇතුළත් වේ.

**බුද්ධිමය දේපල**
බුද්ධිමය දේපල යනු පේටන්ට් බලපත්‍ර, ප්‍රතිරූපණ හිමිකම්, වෙළෙඳ නාම සහ වෙළෙඳ රහස් ආදී අස්පෘශ්‍ය දේපල වේ. බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා නීති හඳුන්වා දී ඇත. අප බුද්ධිමය දේපල සමඟ කටයුතු කරන විට එකී නීති අදාළ වන්නේ කෙසේද යන්න අප විසින් වටහා ගත යුතු වේ.

# සේවාස්ථානය තුළ තාක්ෂණය භාවිත කිරීම

සුරක්ෂිත හා විශ්වසනීය තොරතුරු තාක්ෂණික මූලාශ්‍ර පැවතීම Lineage සමාගමේ ව්‍යාපාර මෙහෙයුම් පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වන අතර, අප ඒවා ආරක්ෂා කිරීම අතිශයින් වැදගත් වේ.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- Follow all Lineage information security policies, including but not limited to the creation, මුරපද නිර්මාණය කිරීම, සැකසීම සහ සැලසුම්ගත ලෙස වෙනස් කිරීම ඇතුළත්ව එහෙත් ඊට සීමා නොවී සියලුම Lineage තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කරන්න.
- Lineage තොරතුරු තාක්ෂණ පද්ධති සුදුසු පරිදි හා මූලිකවම ව්‍යාපාරික අරමුණු උදෙසා පමණක් භාවිත කරන්න.
- අපගේ සයිබර් ආරක්ෂණ කණ්ඩායමේ පූර්ව අනුමැතියෙන් තොරව තොරතුරු තාක්ෂණික වශයෙන් වින්‍යාසගත කර ඇති කිසිදු ආරක්ෂණ සැකසුමක් (උදා:- ප්‍රතිවයිරස මෘදුකාංග, ආකේතන - encryption) වෙනස් කිරීමට, අක්‍රිය කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු නොකරන්න.
- කිසිදු අවස්ථාවක Lineage පද්ධති භාවිතයෙන් නොමනා කිසිවක් යැවීම හෝ කිසිදු නීති විරෝධී හෝ නොමනා අරමුණක් සඳහා ඒවා භාවිත කිරීම හෝ නොකරන්න.
- වෙනත් අයෙකුගේ තොරතුරු භාවිතයෙන් නොව, ඔබගේම ඇතුළු වීමේ තොරතුරු භාවිතයෙන් Lineage පද්ධති වෙත ඇතුළු වීමට වගබලා ගන්න.
- අපගේ පද්ධතිවල හිමිකාරත්වය Lineage සමාගම සතු වන අතර අපගේ පද්ධති හා දත්ත ආරක්ෂා කිරීමේ අරමුණ උදෙසා එකී පද්ධතිවල භාවිතය අධීක්ෂණය කිරීමට හිමිකම (දේශීය නීතිවලට යටත්ව) එම සමාගම සතු බව වටහා ගන්න.
- සැකකටයුතු ක්‍රියාකාරකමක් හෝ සුරක්ෂිතතා ප්‍රතිපත්ති උල්ලංඝනයක් සිදු වීමට ඉඩකඩක් වේ යැයි හැඟේ නම් ඒ බව cyberfusion@onelineage.com වෙත වාර්තා කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### තොරතුරු තාක්ෂණය

සමාගම විසින් ලබා දෙන ලද ජංගම දුරකතන, ලැප්ටොප් පරිගණක සහ ඩෙස්ක්ටොප් පරිගණක ඇතුළු සියලුම වර්ගවල සන්නිවේදන හා පරිගණක උපකරණ සියල්ලම තොරතුරු තාක්ෂණික සම්පත්වලට ඇතුළත් වේ. එසේම, සමාගම විසින් ලබා දී ඇති විද්‍යුත් තැපැල් ගිණුම්, ලේඛන ගබඩා කිරීමේ පද්ධති, අන්තර්ජාල හා ඉන්ට්‍රානෙට් පහසුකම්, ජාල පහසුකම් සහ මෘදුකාංග හා යෙදුම් ද ඊට ඇතුළත් වේ.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

සේවාස්ථානය තුළ තාක්ෂණය භාවිත කිරීමේදී අපගේ Lineage පද්ධති ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අප සියලුම දෙනා අවධානයෙන් පසු වීම අවශ්‍ය වේ.

### පහත ප්‍රශ්න ඔබෙන්ම අසන්න:

- මා විසින් සවිමත් හා මටම ආවේණික මුරපද භාවිත කර තිබේ ද? එසේම මා එම මුරපද නිතර නිතර යාවත්කාලීන කරන්නේ ද?
- මා ආරක්ෂිත ජාලයකට සම්බන්ධව සිටින්නේ ද?
- කවර හෝ සැක සහිත විද්‍යුත් තැපැල් පණිවිඩයක් හෝ සන්නිවේදනයක් ලැබෙන්නේ නම් මා ඒ බව හඳුනා ගැනීම, මකා දැමීම සහ වාර්තා කිරීම සිදු කරන්නේ ද?
- මා මගේ රැකියා වගකීම් ඉටු කරන්නේ ව්‍යාපාරයට අදාළ දත්ත Lineage පද්ධති හා උපාංග වෙතින් භාවිත කරමින් සහ ඒ තුළ ගබඩා කරමින් ද?
- පද්ධතිවලට ඇතුළු වීමේ මගේ රහස්‍ය තොරතුරු (මුරපදය වැනි) අන් අයට දැන ගැනීමට නොහැකි බවට මා සුපරීක්ෂාකාරී ද?

සෑම විටම ඉහත ප්‍රශ්නවලට පිළිතුර “ඔව්” යන්න විය යුතු ය. අපගේ තාක්ෂණය ආරක්ෂිත ලෙස පවත්වා ගැනීමට අප ප්‍රමුඛතාව ලබා දෙන විට අපට අපගේ දාමය එක්ස සවිමත් කළ හැක.

# දත්ත ආරක්ෂාව, පෞද්ගලිකත්වය සහ පුද්ගලික තොරතුරු

Lineage හි සේවය කරන අතරතුරේදී අපට එකිනෙකාගේ මෙන්ම අපගේ පාරිභෝගිකයන්ගේ ද පුද්ගලික හා සංවේදී තොරතුරු වෙත ප්‍රවේශය ලැබීමට ඉඩ ඇත. Lineage සමාගම විසින් අපගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම හා භාවිත කරනු ලැබීම සිදු කෙරෙනුයේ පෞද්ගලිකත්වය යනු මානව අයිතිවාසිකමක් ලෙස සලකමින් අපගේ වටිනාකම්වලට සහ අදාළ නීතිවලට අනුකූලව වන බවට විශ්වාසය තැබීමට අයිතියක් අප සියලු දෙනාටම ඇත.

පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා සකස් කර ඇති නීති රැසක් ලොව පුරාවටම දැකිය හැක. අපගේ මෙහෙයුම්වලට අදාළ වන සහ අප ක්‍රියාත්මක වන නෛතික සීමාව තුළ බලාත්මක දත්ත පෞද්ගලිකත්ව හෝ දත්ත ආරක්ෂණ නීති, රෙගුලාසි හා ක්‍රමවේද සියල්ලටම අනුකූලතාව දක්වමින් මෙම තොරතුරු ආරක්ෂා කිරීමේ වගකීම අප සෑම දෙනාම වෙත පැවරේ.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- පුද්ගලික තොරතුරු හඳුනා ගන්නා අයුරු වටහා ගන්න.
- සුවිශේෂී අවසරයක් හෝ රැකියාවට අදාළ වලංගු හේතුවක් නොමැතිව කිසිදු අවස්ථාවක කණ්ඩායම් සාමාජිකයෙකුගේ, පාරිභෝගිකයෙකුගේ, සැපයුම්කරුවෙකුගේ, ආයෝජකයෙකුගේ හෝ වෙනත් Lineage පාර්ශ්වකරුවෙකුගේ පුද්ගලික තොරතුරක් අන් අය හා බෙදා නොගන්න.
- මුල් අවස්ථාවේදී රැස් කරන ලද අභිමතාර්ථය සඳහාම පමණක් පුද්ගලික තොරතුරු රැස් කිරීම හා භාවිත කිරීම සිදු කරන්න.
- එකඟතාවක් හෝ අවසරයක් ඔබට ලැබී ඇත්නම් හැර අන් කිසිදු අවස්ථාවක Lineage සමාගම තුළ හෝ ඉන් පරිබාහිර කිසිදු පුද්ගලයෙකු සමඟ පුද්ගලික හා රහස්‍ය තොරතුරු බෙදා නොගන්න.
- කිසියම් තොරතුරක් පුද්ගලික තොරතුරක් ලෙස වර්ග කෙරෙන්නේ ද යන්න හෝ පුද්ගලික තොරතුරු හැසිරවිය යුතු ආකාරය පිළිබඳව ඔබට ප්‍රශ්න තිබේ නම්, ඔබේ Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගන්න.
- Lineage පෞද්ගලිකත්ව දැනුම්දීම්වලට අනුකූලව Lineage සමාගම විසින් සිය දත්ත භාවිත කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්න.
- ඉල්ලීම් කර ඇති විට සාවද්‍ය තොරතුරු නිවැරදි කරමින් සහ පුද්ගලයන්ගේ නෛතික අයිතිවාසිකම්වලට ගරු කරමින් පුද්ගලික තොරතුරු යාවත්කාලීන කොට පවත්වා ගන්න.
- පුද්ගලික තොරතුරු රහස්‍ය හා ආරක්ෂිත ලෙස පවත්වා ගන්න.
- දේශීය නීතිවලට අනුකූලතාව දක්වන බව සහතික කරනු පිණිස අදාළ රටෙන් පිටතට පුද්ගලික තොරතුරු ලබා දීමට පෙර නීති දෙපාර්තමේන්තුව සමඟ අදාළ කටයුතු සපුරාලන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

අප ජීවත් වන්නේ අපගේ අභිමතයෙන් බැහැරව වුවද පුද්ගලික තොරතුරු අවභාවිත වීමේ හැකියාවක් ඇති ඩිජිටල් ලෝකයක ය. මේ නිසා, අපගේ දෛනික කටයුතු අතරවාරයේදී ඉතා සුපරීක්ෂාකාරී වීම වැදගත් වේ. පුද්ගලික තොරතුරු සමඟ කටයුතු කිරීමේදී හෝ ඒවා ගබඩා කිරීමේදී නැවත නැවතත් පරීක්ෂා කොට බැලීම සෑම විටම වටිනා පියවරකි. නිදසුනක් වශයෙන්, අපට මෙවැනි ප්‍රශ්න අපගෙන්ම ඇසිය හැක:

- **මා මෙම විද්‍යුත් තැපැල් පණිවිඩය යවන්නේ එය ලැබිය යුතු පුද්ගලයාටම ද?**
- **මා "Reply All" විකල්පය තෝරා ගත යුතුද, නැතහොත් මෙම විද්‍යුත් තැපැල් පණිවිඩය ලැබිය යුතු පුද්ගලයන් කවුදැයි නැවත පිරික්සා සීමා කළ යුතු ද?**
- **මා විසින් ව්‍යාපාරික අරමුණු හෝ අවම නෛතික අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය කාලයට වඩා වැඩි කලක් පුද්ගලික දත්ත රඳවා ගෙන තිබේද?**
- **අපගේ පාරිභෝගිකයන් හෝ කණ්ඩායම් සාමාජිකයන් සාධාරණ ලෙස අපේක්ෂා නොකරන ලද අරමුණු සඳහා මා විසින් පුද්ගලික දත්ත රැස් කරනු ලැබ හෝ භාවිත කරනු ලැබ තිබේ ද?**
- **මෙම පණිවිඩය ලැබෙන්නේ එය ලැබීමට අවසර ලත් පුද්ගලයන්ට පමණක් බව සහතික කොට දැන ගැනීම උදෙසා මා විසින් "Send" යන්න එබීමට පෙර නැවත වරක් පිරික්සා බලන ලද්දේ ද?**

ඔබ කිසිවක් යවන ලද්දේ එය ලැබීමට නුසුදුසු පුද්ගලයෙකු වෙත නම් හෝ අපගේ ප්‍රතිපත්තිවලට අනුකූල නොවන ආකාරයෙන් ඔබ විසින් කිසිවක් රැස් කරනු ලැබ හෝ ගබඩා කරනු ලැබ තිබේ නම්, වහාම ඔබගේ Speak Up සම්පත් පුද්ගලයන් වෙත ඒ බව දැනුම් දෙන්න. ගත යුතු ඉදිරි පියවර සම්බන්ධයෙන් ඔවුන් ඔබට උපකාර කරනු ඇත.

## එකට සම්බන්ධ කිරීම

### පුද්ගලික තොරතුරු

පුද්ගලික තොරතුරු යනු, නම් වශයෙන් හඳුනා ගැනීමෙන් තොරව පවා කිසියම් පුද්ගලයෙකුට හෝ ඔහුගේ හෝ ඇයගේ අනන්‍යතාවට අදාළ වන ඕනෑම තොරතුරකි. නිදසුනක් වශයෙන්, පුද්ගලයෙකුගේ නමක් හෝ ලිපිනයක් වැනි තොරතුරක් පුද්ගලික තොරතුරක් ලෙස හැඳින්විය හැක. මීට අදාළ තවත් නිදසුන් වශයෙන් උපන් දින, විද්‍යුත් තැපැල් ලිපින, දුරකතන අංක හෝ ඡායාරූප ආදිය පවා දැක්විය හැක.

# සුපරීක්ෂාකාරී සන්නිවේදනය හා සමාජ මාධ්‍ය

අප සන්නිවේද?නය කර?න ආකා?රය සම?ාගමක් ලෙස අප කවුරුන්ද යන්න පිළිබිඹු කරයි. SEC වෙත ගොනු කර ඇති තොරතුරු ඇතුළුව අපගේ පොදු සන්නිවේදනයන්හි තොරතුරු කාලෝචිත, සාධාරණ සහ නිවැරදි? විය යුතු ය. අපගේ ගනුදෙනුකරුවන්, ආයෝජකයින්, අසල්වාසීන්, කණ්ඩායම්? සාමා?ජිකයින් සහ සාමාන්‍ය ජනතාව අපෙන් අවංකභාවය සහ ස්ථාවරත්?වය ලැ?බිය යු?තු ය?. අප සමාජ මාධ්‍යවල අදහස් පළ කිරීම ද ඇතුළුව අපගේ සියලුම සන්නිවේදනයන්හිදී මනා තීරණ ගැනීම් සිදු කිරීම තුළින් Lineage කීර්ති නාමයට හානි සිදු විය හැකි අවදානම්සහගත අන්තර්ජාල ක්‍රියාකාරකම් වැළැක්වීමට අපි පියවර ගනිමු - එසේම, අප එසේ කරනුයේ අපගේ අභිමතාර්ථ, වටිනාකම්? හා සන්නාමය හා සැසඳෙන වැදගත් තොරතුරු බෙදාහදා ගැනීමට අපට ඉඩකඩ සැලසෙන ආකාරයට බව ද සඳහන් කළ යුතු ය.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- සමාජ මාධ්‍යවල අදහස් පළ කිරීමද ඇතුළත් අපගේ සියලුම සන්නිවේදනයන්හිදී වෘත්තීයභාවයෙන් යුතුව කටයුතු කිරීම සහ මනා තීරණ ගැනීම සිදු කරන්න.
- සමාජ මාධ්‍යවල අදහස් පළ කිරීමේදී පාරිභෝගිකයන්ට අදාළ වෙළෙඳ නාම, ග්‍රැෆික් හෝ රූප පළ කිරීමට පෙර අලෙවිකරණ හා සන්නිවේදන කණ්ඩායමෙන් ලිඛිත අවසරය ලබා ගන්න.
- Lineage හිමිකාර තොරතුරු කිසිවක් බෙදාහදා නොගන්න.
- Lineage හි ස්වාධීන විගණකවරුන්, රාජ්‍ය නියාමකයින් සහ ස්වයං-නියාමන සංවිධාන ඇතුළුව Lineage පිළිබඳ ද්‍රව්‍යමය කරුණු දැනු?වත්ව වැරදි ලෙස නිරූපණය කිරීමට හෝ නොකර සිටී?මට හෝ අන් අය වැරදි ලෙස නිරූපණය කිරීම හෝ නොකර සිටීම සඳහා ඉඩ සැලස්වීම නොකරන්න.
- ඔබේ රාජකාරි සඳහා යෝග්‍ය පරිදි Lineage සඳහ?ා අ?දාළ වන හෙළිදරව් කිරීමේ අවශ්‍යතා, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි පිළිබඳ හුරුපුරුදුකම පවත්?වා ගන්න.
- Lineage සමාගම නියෝජනය කරන බවක් පෙන්නුම් කෙරෙන සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කිරීමෙන් හෝ ඔබේ Lineage නිල විද්‍යුත් තැපැල් ලිපිනය යොදා ගෙන පුද්ගලික සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කිරීමෙන් වළකින්න.
- බාහිර මූලාශ්‍ර නොහොත් පාර්ශ්ව වෙතින් ලැබෙන විමසුම් සියල්ලම මහජන සම්බන්ධතා කළමනාකාර වෙත යොමු කරන්න. එසේම, අලෙවිකරණ හා සන්නිවේදන කණ්ඩායමෙහි අවසරය ලැබුණු විට පමණක් Lineage වෙනුවෙන් අදහස් පළ කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### සමාජ මාධ්‍යවල අදහස් පළ කිරීම

සමාජ මාධ්‍ය යනු අප සියලු දෙනා එකිනෙකට සම්බන්ධ කරන අදහස් බෙදාහදා ගැනීමේ ප්‍රබල මෙවලමකි. සමාගමක් වශයෙන්, අපගේ පාරිභෝගිකයන් හා මහජනතාව සමඟ සබැඳී සිටීමට Lineage සමාජ මාධ්‍ය අවකාශ භාවිත කරයි. Lineage බොහෝ විට අපගේ කණ්ඩායම් සාමාජිකයන් දැක්වෙන ඡායාරූප සහ වීඩියෝ පට අපගේ සමාජ මාධ්‍ය අඩවිවල පළ කරයි (නිදසුනක් වශයෙන් ඉන්ස්ටග්‍රම් හි Day in the Life පෝස්ට් වැනි). අපගේ කණ්ඩායම් සාමාජිකයන් දැක්වෙන අලෙවිකරණ හා සන්නිවේදන පෝස්ටු අපගේ ආයතනික සමාජ මාධ්‍ය අවකාශවල පළ කිරීමට පෙර, එසේ කිරීමට නිසි අවසරය අපට තිබේ ද යන්න සහතික කරනු පිණිස අප කටයුතු කළ යුතු වේ. කෙසේ වෙතත්, ඔබ කිසියම් Lineage අලෙවිකරණ අන්තර්ගතයක ඔබ සිටිනු දුටුවහොත් හෝ එසේ කිරීම සඳහා අවසරය ලබා දීමක් සිදු නොකරන ලද්දේ නම්, ඔබගේ අභිමතය පරිදි එය ඉවත් කරන ලෙස ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත. මාධ්‍ය පුස්තකාලයෙන් ඔබේ රූපය ඉවත් කිරීම සඳහා ඔබට ජ්‍යෙෂ්ඨ කළමනාකාර, ඩිජිටල් සන්නිවේදන වෙත යොමු විය හැක.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

අදහස් බෙදා ගැනීම, ඉගෙන ගැනීම හා වර්ධනය වීම උදෙසා පෞද්ගලික මෙන්ම වෘත්තීය වශයෙන් ද සමාජ මාධ්‍ය භාවිත කරන ලෙස අපි ඔබ දිරිමත් කරන්නෙමු - එහෙත්, ඔබ ගෞරවනීය හා වගකීම්සහගත අයුරින් එසේ කරනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු. ඔබ Lineage කණ්ඩායමේ සාමාජිකයෙකු වන බැවින්, ඔබ බෙදා ගන්නා හෝ අදහස් පළ කරන අන්තර්ගතයන් මෙන්ම සමාජ මාධ්‍යවල 'like' කරන අන්තර්ගතයන් සම්බන්ධයෙන් පරීක්ෂාකාරීව හැසිරෙන ලෙස අපි ඉල්ලා සිටිමු - ඔබේ පෞද්ගලික සමාජ මාධ්‍ය පිටුවල පවා. ඔබ Lineage කණ්ඩායමේ සාමාජිකයෙකු වන බැවින්, රාජකාරී කටයුතුවලින් බැහැරව සිටින විට පවා ඔබ Lineage නියෝජනය කරන්නෙකි.


### කිසියම් අන්තර්ගතයක් පළ කිරීමට පෙර, පහත ප්‍රශ්න ඔබෙන්ම අසන්න:

- මා පළ කරන්නේ සිතීමට යමක් ඇති සහ ගෞරවනීය අන්තර්ගතයක් ද?
- මෙය, කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් සමඟ අභිමානයෙන් මට බෙදාහදා ගත හැකි අන්තර්ගතයක් ද?
- රැකියා ස්ථානයේදී මා දෙස බැලිය යුත්තේ කෙසේ ද යන්න මෙමඟින් නිරූපණය වේ ද?
- මාගේ පෞද්ගලික සමාජ මාධ්‍ය අන්තර්ගතයන් Lineage සමාගම වෙත සෘණාත්මක ආකල්පයක් ඇති වන පරිදි වැරදි ලෙස අර්ථකථනයන්ට ලක් වීමට ඉඩ තිබේ ද?
- මගේ පෞද්ගලික අන්තර්ගතයන් මගේම අදහස් බවටත් එමඟින් Lineage හි ආකල්ප නියෝජනය නොවන බවටත් පැහැදිලි අදහසක් මා සතු ද?
- Lineage සමාගම, අපගේ පාරිභෝගිකයන් හෝ ව්‍යාපාරික හවුල්කරුවන් පිළිබඳ මගේ සමාජ මාධ්‍ය අන්තර්ගතයන් මඟින් සුරක්ෂිතතාව හෝ රහස්‍යභාවය විෂයික අවදානමක් මතු කෙරෙන තොරතුරු ඉස්මතු විය හැකි ද?

අප එකී ප්‍රශ්න අසන විට, අපගේ පෞද්ගලික කීර්තිය හෝ Lineage සමාගමේ කීර්ති නාමය හෝ අවදානමට නොහෙළා වටිනා මූලාශ්‍රයක් වශයෙන් අපට සමාජ මාධ්‍ය භාවිත කළ හැක.

# නීති විරෝධී වෙළෙඳාම්

නීති විරෝධී වෙළෙඳාම් වැළැක්වීමේ නීති සකස් කර ඇත්තේ වෙළෙඳපොල තුළ අසාධාරණ වාසි අත්කර ගැනීම් වැළැක්වීමේ අරමුණින් වන අතර, එකී කටයුතු වැළැක්වීම සම්බන්ධයෙන් අපි සියලු දෙනාම වගකීම දරන්නෙමු. ඔබේ මූල්‍ය හෝ වෙනත් පුද්ගලික ප්‍රතිලාභයක් උදෙසා සැලකිය යුතු මට්ටමේ ප්‍රසිද්ධ නොවන තොරතුරු යොදා ගැනීම හෝ ඒවා අන් අය හා බෙදා ගැනීම මඟින් Lineage ප්‍රතිපත්ති හා රටෙහි නීති උල්ලංඝනය කෙරේ. Lineage ප්‍රසිද්ධ නොකරන තොරතුරු වෙත අපට ප්‍රවේශය ඇති විට අපි සියලුම දෙනා අපගේ ආචාර ධාර්මික හා නෛතික බැඳීම් නිසි පරිදි ඉටු කිරීමට කැප විය යුත්තෙමු. සමාගමක් වශයෙන් Lineage වර්ධනය වීමේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව පසු වීම අතිශයින් වැදගත් වේ.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- වැදගත් හා සැලකිය යුතු මට්ටමේ ප්‍රසිද්ධ නොවන තොරතුරු කිසිවක් මූල්‍ය හෝ වෙනත් කිසිදු පුද්ගලික ප්‍රතිලාභයක් වෙනුවෙන් භාවිත කිරීම හෝ බෙදා ගැනීම සිදු නොකරන්න.
- ප්‍රසිද්ධ නොවන වැදගත් තොරතුරු පිළිබඳව ඔබ අවබෝධයෙන් පසු වන අතරතුරදී සෘජුවම හෝ පවුලේ සාමාජිකයන්, වෙනත් පුද්ගලයන් හෝ ආයතන හරහා කිසිදු සමාගමක සුරැකුම්පත් මිල දී ගැනීම හෝ විකිණීම කිසි විටෙකත් සිදු නොකරන්න.
- කිසියම් සමාගමකට අදාළ වැදගත් ප්‍රසිද්ධ නොවන තොරතුරු ඔබ සතුව ඇති විට එවන් කිසිදු සමාගමක සුරැකුම් මිල දී ගැනීම හෝ විකිණීම සිදු කරන ලෙස කිසිවෙකුට නිර්දේශ නොකරන්න.
- Lineage හි ව්‍යාපාරික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන විට පමණක් සහ නිසි අවසරය යටතේ සහ නිසි පාලන විධිවිධාන සහිතව පමණක් වැදගත් ප්‍රසිද්ධ නොවන තොරතුරු බෙදා ගැනීම සිදු කරන්න (සැපයුම්කරුවෙකු සමඟ එළැඹෙන හෙළිදරව් නොකිරීමේ ගිවිසුමක් වැනි).
- කිසියම් වැදගත් ප්‍රසිද්ධ නොවන තොරතුරක් අනිසි ලෙස හෙළිදරව් කර ඇති බව ඔබට දැන ගන්නට ලැබී ඇත්නම් හෝ කිසියම් කාරණයක් අභ්‍යන්තර තොරතුරක්ද යන්න පිළිබඳව ඔබට ප්‍රශ්න තිබේ නම් වහාම ඔබේ Speak Up සම්පත් පුද්ගලයන් සම්බන්ධ කර ගන්න.

## එකට සම්බන්ධ කිරීම

### වැදගත් ප්‍රසිද්ධ නොවන තොරතුරු

ප්‍රසිද්ධ නොවන තොරතුරු යනු, ඔබේ රැකියා භූමිකාව තුළ Lineage පිළිබඳව හෝ අප කටයුතු කරන අනෙකුත් සමාගම් පිළිබඳව ඔබට දැන ගන්නට ලැබෙන මහජනතාවට ප්‍රසිද්ධ කර නොමැති තොරතුරු වේ. කිසියම් සාධාරණ ආයෝජකයෙකු සුරැකුම් මිල දී ගැනීම, රඳවා ගැනීම හෝ විකිණීම උදෙසා යම් තොරතුරක් වැදගත් සේ සලකනු ලබන්නේ නම් හෝ එම තොරතුර ප්‍රසිද්ධ කිරීමෙන් යම් සමාගමක කොටස් මිල කෙරෙහි බලපෑමක් එල්ල වීමේ ඉඩකඩක් තිබේ නම්, එය “වැදගත්” තොරතුරක් ලෙස සැලකේ.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

අභ්‍යන්තර තොරතුරු ආරක්ෂා කිරීම මඟින් Lineage සමාගමට අදාළ නීතිවලට අනුකූලතාව දැක්වීමටත්, විශ්වසනීය සමාගමක් වශයෙන් අපට හිමි කීර්ති නාමය පවත්වා ගැනීමටත් අවකාශ සැලසෙයි. අභ්‍යන්තර තොරතුරු ස්වරූප කිහිපයකින් පැවතිය හැක.

### ඔබෙන් අසන්න

මෙම තොරතුර පහත කාරණා හා සම්බන්ද වන්නක් ද?

- සිදු විය හැකි ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක්, අත්පත් කර ගැනීමක්, විකුණා දැමීමක් හෝ මූල්‍යකරණයක්?
- පාරිභෝගික හෝ වෙළෙන්දන් සමග සබඳතා?
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙහි වෙනස් වීම්?
- නව සේවා ලබා දීම් හෝ තාක්ෂණික සංවර්ධනයන්?
- ආයෝජන, ව්‍යාපාර ව්‍යාප්තිකරණයන් හෝ නව වැඩබිම්?

ඔබේ පිළිතුර “ඔව්” යන්න නම්, මෙය හෙළිදරව් නොකළ යුතු වැදගත් ප්‍රසිද්ධ නොවන තොරතුරකි. කිසියම් තොරතුරක් අභ්‍යන්තර තොරතුරක් ද යන්න පිළිබඳව ඔබට කවර හෝ ප්‍රශ්නයක් තිබේ නම් නීති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගන්න.


අපගේ පාරිභෝගිකයන් සහ පාර්ශ්වකරුවන් සමඟ ආචාර ධාර්මිකව කටයුතු කිරීම
දාමය සවිමත් කිරීම

# අපගේ පාරිභෝගිකයන් සහ පාර්ශ්වකරුවන් සමඟ ආචාර ධාර්මිකව කටයුතු කිරීම

## ප්‍රතිභාරය සහ සාධාරණ තරගකාරීත්වය

ප්‍රතිභාර හා තරගකාරීත්වය පාලනය කිරීමේ නීති සකසා ඇත්තේ සාධාරණ වෙළෙඳ අවකාශයක් ඇති කිරීමේ සහ තරගකරුවන් අතර නීතියට පටහැනි හා අසාධාරණ ගිවිසුම් ඇති වීම වැළැක්වීමේ අරමුණිනි. තරගකරුවෙකු වෙළෙඳපොලින් බැහැර කිරීම අරමුණු කර ගත් ක්‍රියාකාරකම් ඇතුළු වෙළෙඳපොල බලය අවභාවිත කිරීමේ ක්‍රියාවන් ද එමගින් තහනම් කෙරේ.

Lineage හි අප අපගේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගනු ලබන්නේ ආචාර ධාර්මික නොවන හෝ නීති විරෝධී ව්‍යාපාරික පිළිවෙත් ඔස්සේ නොව, ඉතා සවිමත් කීර්ති නාමයක් සහ අපගේ සේවා හා නිෂ්පාදන සතු අති විශිෂ්ට කාර්යසාධන මත පිහිටමිනි. අප ක්‍රියාත්මක වන නෛතික සීමාවන්ට අදාළ වන තරගකාරීත්ව සීමා වටහා ගෙන ඒවාට අනුකූලව කටයුතු කිරීමේ වැදගත්කම වටහා ගැනීම අප සියලු දෙනාගේම වගකීමකි.

### එකට සම්බන්ධ කිරීම

**තරගකරුවන් සමඟ නීතියට පටහැනි අන්තර්ක්‍රියා පැවැත්වීම**

- අනාගත මිල වැඩිවීම්, අඩු කිරීම් හෝ වට්ටම් ඇතුළු වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු කිසිවවක් සාකච්ඡා කිරීමෙන් හෝ හුවමාරු කර ගැනීමෙන් වළකින්න.
- Lineage සතු වත්මන් හෝ හෝ අනාගත උපායමාර්ගය සාකච්ඡා කිරීමෙන් හෝ හුවමාරු කර ගැනීමෙන් වළකින්න.
- පහත කාරණා සාකච්ඡා කිරීමෙන් හෝ ඊට එකඟ වීමෙන් වළකින්න:
  - මිල ගැලපුම්වල කාලය හෝ ව්‍යුහය හෝ වෙනත් වාණිජමය කාරණා ඇතුළත්ව මිල ගැලපුම් හෝ මිල ස්ථායීකරණයන් වැනි මිල හෝ මිල සංරචක
  - වෙළෙඳපොල කොටස්, පාරිභෝගික වෙන් කිරීම් හෝ RFP ක්‍රියාවලිය තුළ සහභාගීත්වය පිළිබඳ විස්තර
  - පාරිභෝගිකයන් වර්ජනය කිරීම

### උෂ්ණත්වය පරීක්ෂා කිරීම

අපගේ සාර්ථකත්වයෙන් කොටසක් සැදුම් ලබන්නේ අප සේවා ලබා දෙන වෙළෙඳපොල මනාව වටහා ගැනීම, අපගේ තරගකරුවන් පිළිබඳව ඉගෙන ගැනීම සහ අප නියැළෙන කර්මාන්තයෙහි අප ලබන අත්දැකීම්වලින් උපරිම ඵල නෙළා ගැනීම තුළයි. කෙසේ වෙතත්, තරගකාරී බුද්ධිය රැස් කර ගැනීමේදී, ලබා ගැනීමේදී සහ භාවිත කිරීමේදී අප "සාධාරණ ක්‍රීඩාවක" නිරත වීමත්, සුපරීක්ෂාකාරීව සහ අවංකව කටයුතු කිරීමත් අවශ්‍ය වේ - මෙය අපගේ Lineage විශ්වාසය හා ගෞරවය පිළිබඳ වටිනාකම්වලට ගරු කිරීමක් ද වේ.

**තරගකාරී තොරතුරු භාවිත කිරීමට පෙර, පහත කාරණා සහතික කර ගැනීමට නැවත පිරික්සන්න:**

- මා විසින් අනෙකුත් තරගකරුවන් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඇත්තේ ඔත්තු බැලීම, සොරකම, සාවද්‍ය නිරූපණ හෝ ගිවිසුමක් හෝ රහස්‍යතා බැඳීමක් කඩ කිරීමක් වැනි නොමනා ක්‍රම අනුගමනය කිරීමෙන් ද?
- අපට සිදු කළ නොහැකි කාර්යයක් ඉටු කරවා ගැනීමට මා විසින් තුන්වැනි පාර්ශ්වයකින් ඉල්ලා තිබේ ද?
- රහස්‍ය තොරතුරු ලබා ගැනීම උදෙසා මා විසින් තරගකරුවෙකුට අයත් සේවකයෙකු බඳවා ගෙන තිබේ ද?

ඉහත කවර හෝ ප්‍රශ්නයකට "ඔව්" යන පිළිතුර ලැබුණහොත් ඉන් අදහස් වන්නේ ගැටලුවක් පැවතීමේ ඉඩක් ඇති බවයි. තරගකරුවන් සමඟ පවත්වන අන්තර්ක්‍රියා සම්බන්ධයෙන් ඔබට ප්‍රශ්න කිසිවක් තිබේ නම් වහාම නීති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගන්න.

### කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- ප්‍රතිභාර හා තරගකාරීත්ව පාලන නීති සංකීර්ණ ස්වභාවයක් ගන්නා අතර, ඔබට ප්‍රශ්න ඇති ඕනෑම අවස්ථාවක නොපැකිළව නීති දෙපාර්තමේන්තුවේ උපදෙස් පතන්න.
- වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු කිසිවක් අපගේ තරගකරුවන්, ඔවුන්ගේ සේවකයන් හෝ නියෝජිතයන් සමඟ ඍජුව හෝ වක්‍රව සාකච්ඡා කිරීම, ඔවුන්ගෙන් එකී තොරතුරු ලබා ගැනීම හෝ ඔවුන් හා බෙදාහදා ගැනීම සිදු නොකරන්න. වාණිජමය හෝ තරකගාරීමය වශයෙන් සංවේදී තොරතුරක් යනු ඔබ විසින් "ව්‍යාපාරික රහසක්" ලෙස සැලකිය යුතු ඕනෑම තොරතුරකි (උදා:- මිල, පිරිවැය, සම්මුතීන්, පරිමාවන්, පාරිභෝගිකයන්, වෙළෙඳපොල, වෙළෙඳපොල උපායමාර්ග, වාණිජ උපායමාර්ග ආදිය පිළිබද තොරතුරු).
- තරගකාරීත්වය කෙරෙහි සීමා පනවන කිසිදු විධිමත් හෝ අවිධිමත් ගිවිසුමක් කිසිවක් වෙත එළැඹීමෙන් වළකින්න.
- පාරිභෝගිකයන් සමඟ කතා කිරීමේදී Lineage නිෂ්පාදන හා සේවා පිළිබඳව සත්‍යවාදීව හා නිවැරදිව විස්තර කරන්න.
- වෙළෙඳ සංවිධාන රැස්වීම් හෝ එක්රැස්වීම්වලදී විශේෂයෙන් සුපරීක්ෂාකාරී වන්න - එසේම, රහස්‍ය තොරතුරු හෝ කවර හෝ සීමා ඉක්මවන මාතෘකා පිළිබඳ සංවාදවලින් බැහැරව සිටින්න.
- ඔබට අදාළ නොවන තරගකරුවෙකුට අදාළ රහස්‍ය හෝ වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු ඔබට හමු වන්නේ නම් නීති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගන්න.

# දූෂණ හා අල්ලස් විරෝධය

Lineage සමාගම කිසිදු ලෙසකින් අල්ලස් ගැනීම් හෝ දූෂණ නොඉවසයි. අපි කිසිදු අවස්ථාවක රාජ්‍ය නිලධාරීන්, වාණිජ ව්‍යාපාරික හවුලකරුවන්, රාජ්‍ය ආයතන හෝ වෙනත් කවර හෝ පුද්ගලයෙකු වෙත අල්ලස් ලබා දීම හෝ ඔවුන්ගෙන් අල්ලස් ලබා ගැනීම හෝ නොකරන්නෙමු. මෙම ආචාර ධර්ම සංග්‍රහයේ සියලුම අංශ පරිදිම මෙම කාරණය ද Lineage හි සේවයේ නියුතු පුද්ගලයන් සියලුම දෙනාට පමණක් නොව අපගේ ඕනෑම නියෝජිතයෙකු හෝ ව්‍යාපාරික හවුල්කරුවෙකු ඇතුළත්ව අප වෙනුවෙන් කටයුතු කරන ඕනෑම පාර්ශ්වයක් වෙත ද අදාළ වේ.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- වාසිදායක ව්‍යාපාරික කටයුත්තක් හෝ තීන්දුවක් කෙරෙහි බලපෑමක් එල්ල කිරීමේ ප්‍රයත්නයක් අරමුණු කර ගෙන වටිනා කිසිදු දෙයක් ලබා දීම හෝ ලබා ගැනීම සිදු නොකරන්න.
- කිසිදු අවස්ථාවක ගෙවීමක් සැඟවීමට කටයුතු නොකරන්න; ගෙවීම් සියල්ලම නිවැරදිව හා අංග සම්පූර්ණ ලෙස Lineage හි පොත් හා වාර්තාවල ලේඛනගත කළ යුතු වේ.
- උපදේශකයෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු වැනි තුන්වැනි පාර්ශ්වයක් සමඟ කටයුතු කිරීමට පෙර Lineage හි නිසි ප්‍රතිපත්ති සපුරාලීම උදෙසා නීති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගන්න.
- තුන්වැනි පාර්ශ්වයන්ගේ ක්‍රියාවන් Lineage ප්‍රතිපත්තිවලට අනුකූල වන බව සනාථ කරනු පිණිස ඔවුන් සුපරීක්ෂාකාරී ලෙස අවේක්ෂණය කරන්න.
- ගනුදෙනු හා ගෙවීම් සියල්ලම සත්‍යවාදී ලෙස හා නිසි කලට වාර්තා කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### අල්ලස්

අල්ලසක් යනු කිසියම් පුද්ගලයෙකුට යම් නිශ්චිත ආකාරයකට ක්‍රියා කිරීමට පෙළඹවීම උදෙසා ලබා දෙන හෝ එකී ක්‍රියාව වෙනුවෙන් හුවමාරු කරනු ලැබෙන වටිනාකමින් යුතු කිසිවක් වේ. අල්ලස් සෑම අවස්ථාවකදීම මුදල් ස්වරූපයෙන් නොපවතින අතර තවත් වෙනත් ස්වරූප රැසකින් ලබා දිය හැක. නිදසුනක් වශයෙන් කාර්යයන් ඉක්මන් කරවා ගැනීම උදෙසා ලබා දෙන ගෙවීම්, අයුතු ලාභ උදෙසා ලබා දෙන දීමනා, නීති විරෝධී පාරිතෝෂික හෝ ණය, රෙෆරල්, ත්‍යාග, උත්සව සඳහා ටිකට් පත්, ආහාර, ප්‍රවාහන වියදම් හා රැකියා අවස්ථා ආදී ඊට සමාන වෙනත් දීමනා හා ගෙවීම් දැක්විය හැක. කවර ආකාරයක හෝ අල්ලසක් ලබා දීමට හෝ ලබා ගැනීමට අපට අවසර නොමැත. අප කටයුතු කරන සෑම දෙනාටම මෙය අදාළ වේ - විදේශ නිලධාරීන් හෝ රජයේ සේවකයන්ගේ සසිට වාණිජ ව්‍යාපාරික හවුල්කරුවන් දක්වා සියලුම දෙනා මීට ඇතුළත් ය. අල්ලස් සිද්ධියක සලකුණු මාත්‍රයක් වුවද හානිකර විය හැකි බැවින් ව්‍යාපාරික අනුග්‍රාහකත්වයක් ලබා දීමේදී හෝ ලබා ගැනීමේදී සෑම විටම සුපරීක්ෂාකාරී වන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

අල්ලස් සිදුවීම් සලකා බැලීමේදී අප වෙනුවෙන් කටයුතු කරන තුන්වැනි පාර්ශ්වයන්හි ක්‍රියා සම්බන්ධයෙන්ද වගවීමක් අප සතු විය හැක. තුන්වැනි පාර්ශ්ව සමඟ කටයුතු කිරීමේදී අප විසින් අපෙන්ම ඇසිය යුතු ප්‍රශ්න කිහිපයක් මෙසේ ය:

- ඔවුන්ගේ අතීත හැසිරීම, ආකල්ප හෝ කීර්ති නාමය පිළිබඳව ගැටලු කිසිවක් ඔබට තිබේ ද?
- ඔවුන්ට රජයේ නිලධාරීන් සමඟ කිසියම් ප්‍රකට සම්බන්ධතා කිසිවක් තිබේ ද?
- ඔවුන් මුදල් ගෙවීම් හෝ කිසිදු පෙනී යන සම්බන්ධතාවක් නොමැති රටක් වෙත ගෙවීමක් ඉල්ලා සිටින්නේ ද?
- සේවා හෝ භාණ්ඩ ලබා දීමට පෙර ඔවුන් ගෙවීම් ඉල්ලා සිටින්නේ ද?
- විස්තර හෝ උපකාරක ලේඛන රහිතව අප වෙත බිල්පත් ලැබී තිබේ ද?

ඉහත කවර හෝ ප්‍රශ්නයකට පිළිතුර “ඔව්” යන්න නම්, අල්ලස් හෝ දූෂණ සිදුවීමක අවදානමක් ඇත - එමෙන්ම, එවිට ඔබ වහාම ඔබගේ Speak Up සම්පත් පුද්ගලයන් හා සම්බන්ධ විය යුතු වේ.

# ත්‍යාග, ආහාර පාන සහ ප්‍රවාහන පහසුකම්

ත්‍යාග හා ව්‍යාපාරික අනුග්‍රාහකත්වයන් යනු සම්බන්ධතා ගොඩනගා ගැනීමට හා පෝෂණය කිරීමට උපකාරී වන අතර පාරිභෝගිකයන් හා ව්‍යාපාරික හවුල්කරුවන් සමඟින් ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අයිතම හුවමාරු කර ගැනීමේදී අප සෑම විටම මනා තීරණ ගෙන කටයුතු කළ යුතු වේ. ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව මත සීමා පැනවීම උදෙසා Lineage හි අප ප්‍රතිපත්ති පිහිටුවා ඇත. මෙම ප්‍රතිපත්ති සහ අපගේ ව්‍යාපාරට අදාළ සහ අප මෙහෙයුම් පවත්වා ගනු ලබන කලාපයෙහි බලපැවැත්වෙන නීති හා රෙගුලාසි සියල්ලටම අනුකූලතාව දැක්වීමට අපි පියවර ගන්නෙමු.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- සාධාරණව හා අපක්ෂපාතී ලෙස තීරණ ගැනීමට අපට ඇති හැකියාවට බලපෑමක් එල්ල නොවන්නේ නම් පමණක් ව්‍යාපාරික විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව ඉලක්ක කර ගත් ත්‍යාග හෝ දීමනා ලබා දීම හෝ භාර ගැනීම සිදු කරන්න.
- ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව මත පනවා ඇති මුදල්මය සීමා අවබෝධ කර ගැනීම සඳහා ඔබේ ප්‍රාදේශීය නීති දෙපාර්තමේන්තුව සමඟ කරුණු පරීක්ෂා කරන්න.
- රජයේ සේවකයන් සමඟ කටයුතු කිරීමේදී අදාළ වන සුවිශේෂී රීති සම්බන්ධයෙන් සැලකිල්ලෙන් පසු වන්න - එසේම, ඔවුන් වෙත කිසිදු අවස්ථාවක ත්‍යාග හෝ විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව ලබා දීමෙන් (හෝ ත්‍යාග හෝ විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව ඔවුන්ගෙන් ලබා ගැනීමෙන්) වළකින්න.
- ත්‍යාග හා විනෝදාස්වාදාත්මක වියදම් සියල්ලම නිවැරදිව සහ අංග සම්පූර්ණ ලෙස වියදම් වාර්තාවල වාර්තා කරන්න.
- මෙම රීති ඔබට පමණක් නොව ඔබේ ආසන්නතම පවුලේ සාමාජිකයන්ට ද අදාළ වන බව අවබෝධ කර ගන්න.

## එකට සම්බන්ධ කිරීම

### භාර ගත හැකි ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්වයන්

ඇතැම් අවස්ථාවලදී සාමාන්‍ය ව්‍යාපාරික සංවර්ධනයෙහිලා ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව ලබා දීම හා භාර ගැනීම සුදුසු වේ. කෙසේ වෙතත්, රජය සමඟ කටයුතු කිරීමේදී ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව ලබා දීම හෝ භාර ගැනීම කිසිදු විටෙකත් යෝග්‍ය නොවේ. ත්‍යාග හා විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්වයන් සියල්ලම පහත අවශ්‍යතා සපුරාලිය යුතු ය:

- පිළිගත් ව්‍යාපාරික පිළිවෙත් සමඟ ගැලපිය යුතු ය
- නාමික වටිනාකමකින් යුතු විය යුතු ය
- සුදුසු බවින් යුක්ත විය යුතු ය
- නිතර නිතර නොව, කලාතුරකින් සිදු විය යුතු ය
- ස්වේච්ඡාවෙන් ලබා දෙන ලද්දක් විය යුතු ය
- මුදල් හෝ මුදල් සමාන ස්වරූපයකින් ලබා නොදුන්නක් විය යුතු ය
- අදාළ ත්‍යාගය පිළිබඳව ප්‍රසිද්ධියේ හෙළිදරවු කළහොත් එය ලබන්නා හෝ Lineage සමාගම අපහසුතාවට පත් නොකරන්නක් විය යුතු ය

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

ත්‍යාග හෝ විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්ව ලබා දීම හෝ භාර ගැනීමට අදාළ තීරණය අවසන් වශයෙන් මනා තීරණ ගැනීම පිළිබඳ එකකි.

### ඔබගෙන්ම අසන්න:

- ත්‍යාගය අධික වටිනාකමකින් යුතු සුඛෝපභෝගී අයිතමයක් ද (සැලසුම් සන්නාමයක් හෝ මිල අධික ක්‍රීඩා උපකරණයක් වැනි)?
- මෙම ත්‍යාගය හෝ ඇරයුම නිසා බැඳීමක් ඇති වේ ද?
- විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්වය ප්‍රමාණය ඉක්මවන්නක් ලෙස සැලකිය හැකි ද (දින ගණනාවක් විනෝද චාරිකා හා සංචාර වැනි)?
- මෙය මුදල් ත්‍යාගයක් ද?
- මෙම ත්‍යාගය හෝ අනුග්‍රාහකත්වය Lineage සමාගම අපහසුතාවයට පත් කරන්නක් හෝ එහි ප්‍රතිරූපය දුර්වල ලෙස පිළිබිඹු කරන්නක් ද?
- ත්‍යාගය ලබා දී ඇත්තේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අතරතුරදී ද?
- ත්‍යාගය ලබන්නා රජයේ නිලධාරියෙකු ද?
- ත්‍යාගය හෝ විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්වය මඟින් එය ලබන්නාට අදාළ ප්‍රතිපත්ති උල්ලංඝනය වන්නේ ද?

මෙම ප්‍රශ්නවලට පිළිතුර සෑම විටම “ඔව්” යන්න විය යුතු ය. කිසියම් ත්‍යාගයක හෝ විනෝදාස්වාදාත්මක අනුග්‍රාහකත්වයක සුදුසු බව පිළිබඳව ඔබට ප්‍රශ්න කිසිවක් තිබේ නම් ඔබේ Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගැනීමට අමතක නොකරන්න.

# වෙළෙඳ අනුකූලතාව

අපගේ සමාගම රටවල් බොහොමයක සහ ලොව පුරාවටම ප්‍රදේශ රැසක ව්‍යාපාර සිදු කරයි. අප ව්‍යාපාරික කටයුතු පවත්වා ගන්නා රටවල් සියල්ලෙහිම අදාළ වන වියලුම වෙළෙඳ අනුකූලතා නීති, රෙගුලාසි හා Lineage ප්‍රතිපත්ති හා ක්‍රමවේද සියල්ලම අවබෝධ කර ගෙන ඒවාට බැඳී සිටීමේ වගකීම අප සියලුම දෙනා වෙත පැවරී තිබේ. ගෝලීය වශයෙන් අපගේ ව්‍යාපාරික ගනුදෙනු කෙරෙහි බලපෑම් එල්ල කරන, භාණ්ඩ, දත්ත, තාක්ෂණය, මෘදුකාංග හා සේවා ආනයනය, අපනයනය හා සම්ප්‍රේෂණය කිරීම පාලනය කරන නීති මෙන්ම ආර්ථික සම්බාධක හා වෙළෙඳ තහනම් ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ පාලනයන් යනාදිය මීට ඇතුළත් වේ.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- අපගේ කාර්යයන්ට අදාළ වන ව්‍යාපාරික ක්‍රමවේද, නෛතික අවශ්‍යතා හා ප්‍රතිපත්ති අවබෝධ කර ගෙන ඒවාට අනුකූලතාව දක්වන්න. එසේම, අදාළ ජාත්‍යන්තර වෙළෙඳ පාලනයන් සම්බන්ධයෙන් ඔබට කිසියම් ගැටලුවක් තිබේ නම් ඔබේ කලාපයට අදාළ නීති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අනුශාසක සම්බන්ධ කර ගන්න.
- ඔබේ රැකියාවට අදාළ වන වෙළෙඳ පාලනයන් දැන සිටින්න. එසේම, ඒවාට අනුකූලතාව දැක්වාය යුතු ආකාරය අවබෝධ කර ගන්න.
- සියලුම නිෂ්පාදන, දත්ත හා තාක්ෂණයන් නැව්ගත කිරීමට, අපනයනය කිරීමට පෙර අවශ්‍ය අපනයන බලපත්‍ර සියල්ලම ලබා ගන්න.
- අදාළ වන ආර්ථික සම්බාධක හෝ වෙළෙඳ තහනම්වලට ලක් වූ පාර්ශ්ව සමඟ ව්‍යාපාරික කටයුතු නොපවත්වන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

ජාත්යන්තර වෙළෙඳ පාලනයන්ට අනුකූලතාව දැක්වීම උදෙසා අප තුන්වැනි පාර්ශ්වයන්හි ක්රියාකාරකම් අවේක්ෂණය කිරීම අවශ්ය වේ.

### ඔබෙන්ම අසන්න:

- ඔබ සම්බන්ධතා පවත්වන ආසන්නතම පුද්ගලයන් පමණක් නොව, කවර හෝ සම්බන්ධයක් ඇති ඕනෑම පුද්ගලයෙකු, කණ්ඩායමක් හෝ රටක් වශයෙන් වන ඔබේ ව්යාපාරික හවුල්කරුවන් ඔබ දැන සිටින්නේ ද?
- අපා ව්‍යාපාරික කටයුතු සිදු කළ නොහැකි ඇතැම් ස්ථාන සහ පුද්ගලයන් ඇති බව ඔබ වටහා ගෙන සිටින්නේ ද?
- නීති නිසි පරිදි අනුගමනය නොකරන බවට ලැබෙන අවවාදාත්මක සංඥා පිළිබඳව ඔබ අවධානයෙන් සිටින්නේ ද?
- ඔබට අවිනිශ්චිතතාවක් තිබේ නම් ඔබ ප්‍රශ්න අසා තිබේ ද?

මෙම ප්රශ්නවලට පිළිතුර සෑම විටම “ඔව්” යන්න විය යුතු ය. කරුණාකර, වෙළෙඳ අනුකූලතාවට අදාළ කවර හෝ ගැටලුවක් වේ නම් ඒ බව වහාම වාර්තා කරන්න, නැතහොත් ඔබට මගපෙන්වීමක් අවශ්ය නම් ඔබේ කලාපීන ප්රධාන අනුශාසක සම්බන්ධ කර ගන්න.

## එකට සම්බන්ධ කිරීම

### විවිධ වෙළෙඳ පාලන වර්ග

**ආනයන:** ආනයනය කරනු ලැබෙන භාණ්ඩ සියල්ලම වර්ගීකරණය, අපනයනය කරනු ලබන රට සලකුණු කිරීම, රඳවා ගැනීම වාර්තා කිරීම හා තීරුබදු, බදු හා ගාස්තු ගෙවීම ඇතුළු අදාළ සියලුම නියාමන අවශ්‍යතා සපුරාලන බව සහතික කරනු පිණිස අප විසින් නිවැරදිව ඒවා වර්ගීකරණය කොට අනෙකුත් අදාළ තොරතුරු සියල්ල ලබා දිය යුතු වේ.

**අපනයන:** අප මෙහෙයුම් පවත්වා ගන්නා රටෙන් බැහැරට යොමු කෙරෙන අයිතම හා තොරතුරු අපනයනය, ප්‍රති අපනයනය හා පැවරීම පාලනය කෙරෙන අදාළ නීති, රෙගුලාසි හා ප්‍රතිපත්ති සියල්ලම අප විසින් අනුගමනය කළ යුතු වේ. කිසිවක් රටෙන් බැහැරට භෞතික වශයෙන් ප්‍රවාහනය නොකෙරෙන අවස්ථාවක වුවද, විද්‍යුත් තැපෑල ඔස්සේ හෝ පරිශ්‍ර සංචාරයක් ලබා දීම තුළින් සංවාදයක් අතරතුරදී ද කිසියම් දෙයක් අපනයනය කිරීමට හැකියාවක් ඇත. නිදසුනක් ලෙස, වෙනත් රටක සිටින පුද්ගලයෙකුට තොරතුරු දැකබලා ගත හැකි විට එම තොරතුරු සුරැකීමට, ගබඩා කිරීමට හෝ ලබා දීමට හැකි විට විදේශ ජාතිකත්වයක් සහිත නිවස්න රටක් වෙත තාක්ෂණය හා මෘදුකාංග “අපනයනය” කළ හැක - Lineage කණ්ඩායම් සාමාජිකයෙකුට පවා.

**වර්ජනය කිරීම්:** අප ව්‍යාපාරික කටයුතු පවත්වන නෛතික බලප්‍රදේශවල ඇතැම් නීති මඟින් ඕනෑම ආකාරයක ජාත්‍යන්තර වෙළෙඳ වර්ජනය කිරීමකට සහාය දැක්වීම සමාගම්වලට තහනම් කරයි. එසේම, කිසියම් රටක එවැනි නීතියක් බලනොපැවැත්වෙන විට පවා එවැනි වර්ජනය කිරීමේ ක්‍රියාකාරකම් අපගේ ප්‍රතිපත්ති මඟින් තහනම් කර ඇත.එසේම, කිසියම් රටක එවැනි නීතියක් බලනොපැවැත්වෙන විට පවා එවැනි වර්ජනය කිරීමේ ක්‍රියාකාරකම් අපගේ ප්‍රතිපත්ති මඟින් තහනම් කර ඇත. නිදසුනක් වශයෙන්, වර්ජනය කිරීමකට සහාය දක්වන භාෂා භාවිතයන් සහිත කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම් සමඟ සම්මුතිගත වීමේදී අප පරීක්ෂාකාරී විය යුතු ය. වර්ජනය කරන ලද රටක් සමඟ ව්‍යාපාර කිරීමට ප්‍රතික්ෂේප කිරීමක් හෝ වර්ජනය කිරීමකට අදාළ හේතූන් මත අසාධු ලේඛනගත පුද්ගලයන් සමඟ ව්‍යාපාර කිරීමට ප්‍රතික්ෂේප කිරීම වැනි.

**ආර්ථික සම්බාධක:** ආර්ථික සම්බාධක මඟින්, විදේශ ප්‍රතිපත්ති සහ ජාතික ආරක්ෂාවට අදාළ ඉලක්ක මත පදනම්ව ඉලක්කගත රටවල්, ආයතන හා පුද්ගලයන් සමඟ ව්‍යාපාර කටයුතුවල නිරත වීමෙන් Lineage වළක්වාලයි. ගෝලීය සමාගමක් වශයෙන් අපි අදාළ සම්බාධකවලට යටත් පාර්ශ්ව සමග කටයුතු නොකළ යුත්තෙමු.

# සැපයුම්කරුවන් සහ සමාගමේ නියෝජිතයන්

ව්‍යාපාරයක් වශයෙන් අපගේ සාර්ථකත්වය සැපයුම්කරුවන්, උපදේශකයන් සහ වෙළෙන්දන් සමඟ අප සතු සවිමත් අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ විශ්වාසය මත පදනම් වන්නකි. Lineage හි අපි සෑම විටම සැපයුම්කරුවන්, උපදේශකයන් හා වෙළෙන්දන් තෝරා ගැනීමේදී සාධාරණ ලෙස කටයුතු කිරීමටත් අපගේ සියලුම ව්‍යාපාරික ගනුදෙනුවලදී අවංකභාවයෙන් ක්‍රියා කිරීමටත් ඇපකැප වන්නෙමු.

අපගේ සැපයුම්කරුවන් යනු අපගේ ප්‍රතිරූපයෙහි පිළිබිඹුවක් බව ද අපි වටහා ගෙන සිටින්නෙමු. එබැවින් Lineage සැපයුම්කරුවන්, උපදේශකයන් සහ වෙළෙන්දන් ඉහළම ආචාර ධාර්මික චර්යා ප්‍රමිතීන් සහ නියාමන අනුකූලතාවන්ට අනුව කටයුතු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

## එකට සම්බන්ධ කිරීම

### මුදල් විශුද්ධිකරණය

මුදල් විශුද්ධිකරණය යනුවෙන් අදහස් වන්නේ නීති විරෝධී මූල්‍ය අරමුදල්වල මූලාශ්‍ර සඟවා තැබීමේ සාපරාධී ක්‍රියාව වන අතර ඇතැම් අපරාධකරුවන් එසේ කිරීම උදෙසා නීත්‍යනුකූල සමාගම් කූට ලෙස යොදා ගනියි. මේ නිසා, මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලට නතු වීමෙන් ආරක්ෂා වීම උදෙසා එවැනි සිදුවීම් හඳුනා ගෙන වළක්වා ගැනීමට අපි කැප වී සිටිමු.

මුදල් විශුද්ධිකරණයන් පිළිබඳ අවවාදාත්මක සංඥා මතු කරන පහත ආකාරයේ අවස්ථා පිළිබඳව අවධානයෙන් පසු වන්න:

- **අසාමාන්‍ය ලෙස විශාල ගනුදෙනු**
- **කිසියම් රටක් සහ තුන්වැනි පාර්ශ්වය අතර කිසිදු පෙනී යන සම්බන්ධයක් නොමැති විට එකී රට වෙත ගෙවීම් සිදු කරන ලෙස ඉල්ලීම් ලැබෙන අවස්ථා**
- **සාධාරණ පැහැදිලි කිරීමක් රහිතව බැංකු ගිණුම් කිහිපයක් වෙත මුදල් ගෙවන ලෙස ලැබෙන ඉල්ලීම්**
- **ගනුදෙනුවට සහාය දක්වන ලේඛනවල විනිවිදභාවයක් නොමැති වීම**

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

Lineage සමාගම වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම අයෙකුගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් අප වගකිව යුතු බැවින් අපගේ හවුල්කරුවන් පිළිබඳව ඉතා හොඳින් දැන සිටීමත් කිසියම් නොමනා ක්‍රියාවක් පිළිබඳ අනතුරු සංඥා සම්බන්ධයෙන් අවධානයෙන් පසු වීමත් වැදගත් වේ. සැපයුම්කරුවන්, වෙළෙන්දන් හා කොන්ත්‍රාත්කරුවන් විමසා බැලීමේදී අප අපෙන්ම ඇසිය යුතු ඇතැම් ප්‍රශ්න මෙසේ ය:

- **තුන්වැනි පාර්ශ්වයක් සමඟ කටයුතු කිරීමට පෙර අප නිසි උද්‍යෝගිමත්භාවය අරමුණු කර ගත් අපගේ ක්‍රියාවලීන් අනුගමනය කර තිබේ ද?**
- **තුන්වැනි පාර්ශ්වයන් සියල්ලම අපගේ අපේක්ෂාවන් මනාව වටහා ගෙන ඒවාට එකඟ වී ඇති බව සනාථ කර ගනු පිණිස අප විසින් අපගේ සේවා සබඳතා තුළදී පසුවිපරම් ගැඹුරින් සිදු කර තිබේ ද?**
- **කොන්ත්‍රාත්තු සම්මුතිගත කිරීමේ ක්‍රියාවලිය තුළදී අවධානයට ලක් වූ අනතුරු සංඥා කිසිවක් වූයේ නම් ඒ පිළිබඳව අප ප්‍රශ්න මතු කොට ඒවා විසඳීමට කටයුතු කර තිබේ ද?**

මෙම ප්‍රශ්නවලට පිළිතුර සෑම විටම “ඔව්” යන්න විය යුතු ය. කිසියම් සැපයුම්කරුවෙකු, උපදේශකයෙකු හෝ වෙළෙන්දෙකු සම්බන්ධයෙන් ඔබට කිසියම් ප්‍රශ්නයක් හෝ ගැටලුවක් වේ නම්, නිසි මාර්ගෝපදේශන ලබා ගැනීමට නීති දෙපාර්තමේන්තුව හෝ මිල දී ගැනීම් හා ප්‍රසම්පාදන කණ්ඩායම සම්බන්ධ කර ගන්න.

## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- **සැපයුම්කරුවන්, උපදේශකයන් සහ වෙළෙන්දන් අපගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිවලට අනුකූලව සහ සුදුසුකම්, මිලකරණය හා Lineage හි අවශ්‍යතා ඉටු කිරීමට ඔවුනට ඇති හැකියාව මත පදනම්ව තෝරා ගන්න.**
- **Lineage හි වටිනාකම් සහ ඒකාබද්ධතාව වෙත කැපවීමක් ප්‍රකට කරන සැපයුම්කරුවන්, උපදේශකයන් සහ වෙළෙන්දන් තෝරා ගන්න.**
- **කිසියම් සැපයුම්කරුවෙකු, වෙළෙන්දෙකු හෝ උපදේශකයෙකු විසින් ලබා දෙන ලද තොරතුරු (උදා:- මිල ගණන්, කොන්දේසි හා නියමයන්, යාන්ත්‍රික ඇඳීම්, තාක්ෂණික ඇඳීම්, අදාළ බුද්ධිමය දේපල හෝ කොන්දේසි) තවත් තුන්වැනි පාර්ශ්වයක් සමඟ බෙදාහදා නොගන්න.**
- **ඉදිරියේදී එක් වීමට ඉඩ ඇති සැපයුම්කරුවන්, වෙළෙන්දන් හෝ උපදේශකයන් සමඟ Lineage සමාගම වෙනුවෙන් කටයුතු කිරීමට පෙර ඔවුනට අදාළ පුද්ගලික, මූල්‍ය හෝ හිමිකාරත්ව අභිලාෂයන් ආයතනික අනුකූලතා සහ ආචාර ධර්ම කණ්ඩායම වෙත හෙළිදරවු කරන්න.**

# තුන්වැනි පාර්ශ්වයන් සතු රහස්‍ය හා හිමිකාර තොරතුරු

අපගේ බොහෝ ව්‍යාපාරික සබඳතා සඳහා සැපයුම්කරුවන්, වෙළෙන්දන්, පාරිභෝගිකයන් සහ මෘදුකාංග සැපයුම්කරුවන් ඇතුළු අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ රහස්‍ය හා හිමිකාර තොරතුරු හුවමාරු කර ගැනීමට සිදු වේ. Lineage සමාගම සතු රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීමට අප ඉතා සුපරීක්ෂාකාරීව කටයුතු කරන පරිදිම, එම සුපරීක්ෂාකාරීභාවයම අප කටයුතු කරන තුන්වැනි පාර්ශ්වයන් සියල්ලම වෙත ද අදාළ කිරීමේ වගකීම අප වෙත පැවරේ.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- පාරිභෝගිකයන් හා ව්‍යාපාරික හවුල්කරුවන් විසින් හෙළිදරව් කරන ලද රහස්‍ය හා හිමිකාර තොරතුරු ආරක්ෂා කිරීමටත් එම තොරතුරු Lineage හි ගිවිසුම්ගත බැඳීම්වලට අනුකූලව හෝ වෙනත් ලෙසකින් තුන්වැනි පාර්ශ්වය විසින් අවසර ලබා දී ඇති පරිදි පමණක් භාවිත කිරීමටත් කටයුතු කරන්න.
- Lineage වෙනුවෙන් නිෂ්පාදන හෝ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමේදී සුපරීක්ෂාකාරී වීමටත්, අදහස් හා නවෝත්පාදනයන් මඟින් කිසියම් තුන්වැනි පාර්ශ්වයක් සතු බුද්ධිමය දේපල කඩ කිරීමක් හෝ තුන්වැනි පාර්ශ්වයක් සමඟ එළැඹි බලපත්‍ර ගිවිසුමක කොන්දේසි උල්ලංඝනය කිරීමක් සිදු නොවන බව සනාථ කිරීමටත් කටයුතු කරන්න.
- කිසිදු අවස්ථාවක තුන්වැනි පාර්ශ්වයකට අදාළ තොරතුරු අන් අය හා බෙදාහදා ගැනීම හෝ හෙළිදරව් කිරීම නොකරන්න.
- තුන්වැනි පාර්ශ්ව සතු රහස්‍ය හා හිමිකාර තොරතුරු වෙත Lineage හි ගිවිසුම්ගත බැඳීම්වලට අනුකූලව සහ ඔබේ රැකියාව ඉටු කිරීමට අවශ්‍ය තරමට පමණක් ප්‍රවේශ වන්න.
- තුන්වැනි පාර්ශ්ව සතු රහස්‍ය හෝ හිමිකාර තොරතුරු භාවිත කිරීම, ඒවාට ප්‍රවේශ වීම හෝ හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් කවර හෝ ගැටලුවක් තිබේ නම් ඔබේ වැඩ පරීක්ෂකගේ හෝ නීති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගන්න.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

කිසියම් පාරිභෝගිකයෙකු හෝ ව්‍යාපාරික හවුල්කරුවෙකු වෙතින් ඔබ වෙත රහස්‍ය හා හිමිකාර තොරතුරු කිසිවක් ලැබී තිබේ නම්, එම තොරතුරු බෙදාහදා ගැනීමට හෝ සාකච්ඡාවට ලක් කිරීමට පෙර පහත ප්‍රශ්න ඔබෙන් අසන්න:

- **තොරතුරු බෙදාහදා ගැනීම සඳහා ලිඛිත අවසරයක් තුන්වැනි පාර්ශ්වය විසින් ඔබට ලබා දී තිබේ ද?**
- **මෙම තොරතුරු බෙදාහදා ගැනීම ඔබේ රැකියාව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නේ ද?**

මෙම ප්‍රශ්න සඳහා පිළිතුර “ඔව්” යන්න නම්, එම රහස්‍ය හා හිමිකාර තොරතුරු බෙදාහදා නොගන්න. යම් තොරතුරක් රහස්‍ය හා හිමිකාර තොරතුරක්ද යන්න ඔබට අවිනිශ්චිත නම් ඔබේ Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගන්න.

## එකට සම්බන්ධ කිරීම

**තුන්වැනි පාර්ශ්ව සතු රහස්ය තොරතුරු සඳහා ඇතැම් උදාහරණ කවරේ ද?**

- උත්පාදනයන්
- මෘදුකාංග
- වෙළෙඳ රහස්
- වෙළෙඳ ලාංඡන
- නම
- නිල ලාංඡන
- හිමිකම් සහිත ද්‍රව්‍ය
- මිලකරණය
- නිෂ්පාදන තොරතුරු
- ව්‍යාපාරික සැලසුම්
- සේවක තොරතුරු


අපගේ ප්‍රජාවන්ට සහාය
වීම සහ මිහිතලය
ආරක්ෂා කිරීම
දාමය සවිමත් කිරීම
BLUE DIAMOND ALMONDS
SMOKEHOUSE
03898
BLUE DIAMOND GROWERS, SACRAMENTO, CA 95811 PRODUCT OF U.S.A.

# දේශපාලනික ක්‍රියාකාරකම්, දේශපාලනික දයකත්වයන් සහ බලපෑම් කිරීම්

සිය පෞද්ගලික කාල වේලාවන්හිදී පුරවැසි හා දේශපාලනික ක්‍රියාවන්හි නිරත වීමට කණ්ඩායම් සාමාජිකයන්ට ඇති අයිතිවාසිකමට Lineage සමාගම සහාය දක්වයි. කෙසේ වෙතත්, අප Lineage ව්‍යාපාරික කටයුතු දේශපාලනික කටයුතුවලින් වෙන් කොට පවත්වා ගැනීමත් ආයතනික දේශපාලනික ක්‍රියාකාරකම් පාලනය කෙරෙන නීති සියල්ලටම අනුකූලතාව දැක්වීමත් වැදගත් වේ.

### කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- Lineage සේවා කාලය තුළදී හෝ Lineage අරමුදල්, උපකරණ, ලිපි ශීර්ෂ හෝ විද්‍යුත් තැපැල් ලිපින ඇතුළු Lineage සම්පත් භාවිත කරමින් දේශපාලනික ක්‍රියාකාරකම්වල නිරත නොවන්න.
- පොදු ෆෝරම වැනි අවකාශවල ඔබේ අදහස් පළ කිරීමේදී ඔබේ අදහස් මඟින් Lineage හි මතය නියෝජනය නොවන බවට පැහැදිලි වන්න.
- දේශපාලනික අවශ්‍යතාවන් හෝ අපේක්ෂකයන් හට සහාය දැක්වීම උදෙසා කිසිදු විටෙකත් ඔබගේ සම සේවකයන්ගෙන් සහාය ඉල්ලා සිටීමෙන් වළකින්න.
- Lineage සමාගම වෙනුවෙන් දේශපාලනික ව්‍යාපාර හෝ දායකත්වයන් සිදු කිරීමෙන් වළකින්න.
- රාජ්‍ය සම්බන්ධතා කණ්ඩායම සමඟ සිදු කරන්නේ නම් හැර අන් කිසිදු අවස්ථාවක Lineage සමාගම වෙනුවෙන් බලපෑම් කිරීමේ කටයුතු කිසිවක නිරත නොවන්න.

### එකට සම්බන්ධ කිරීම

#### බලපෑම් කිරීම යනු කුමක් ද?

නෛතික හෝ පරිපාලනමය ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති කිරීමේ කවර හෝ ප්‍රයත්නයක් ‘බලපෑම් කිරීම’ යන පදයෙන් ආවරණය කෙරේ. සමාගම වෙනුවෙන් බලපෑම් කිරීම් සිදු කිරීමට අවසර ලැබෙනුයේ Lineage හි කණ්ඩායම් සාමාජිකයන් සමහරකට පමණි.

ලියාපදිංචිය සහ හෙළිදරවු කිරීම ඇතුළුව බලපෑම් කිරීමේ කටයුතුවලට අදාළ වන සුවිශේෂී ප්‍රාදේශීය නියාමනයන් හා සීමා කිරීම් බොහෝ විට පවතී. අපරීක්ෂාකාරී බලපෑම් කිරීම් සහ එකී අන්තර්ක්‍රියාවන්හි අයෝග්‍යතා වළක්වාලනු පිණිස රාජ්‍ය නිලධාරීන් සහ සෑම තරාතිරතම රාජ්‍ය සේවකයන් (නීති සම්පාදකයන්, නියාමන නිලධාරීන්, නිලධාරීන් හෝ ඔවුන්ගේ කාර්ය මණ්ඩල) සමඟ තමන් කටයුතු කළ යුත්තේ කවර අයුරින්ද යන්න පිළිබඳව කණ්ඩායම් සාමාජිකයන් ඉතා සුපරීක්ෂාකාරී විය යුතු ය.




### උෂ්ණත්වය පරීක්ෂා කිරීම

Lineage සමාගම දේශපාලනික දායකත්වයන් දැක්වීම තහනම් කරන නීති තිබේ. මෙම නීති රට හා කලාපය අනුව වෙනස් වන අතර Lineage සමාගම රජයේ කොන්ත්‍රාත්තු බලාපොරොත්තු වන්නේද වැනි වෙනත් අවස්ථාවන්හිදී බලපෑ හැක.

#### ඔබෙන්ම අසන්න:

- මගේ දේශපාලනික සක්‍රියභාවය ස්වේච්ඡාත්මක හා පෞද්ගලික එකක් ද?
- මා දේශපාලනික ක්‍රියාකාරකම්වල නිරත වන්නේ Lineage සේවා කාලය හෝ සම්පත් භාවිත නොකරමින් මගේ පෞද්ගලික කාලය හා සම්පත් යොදා ගනිමින් ද?
- මගේ දේශපාලනික මත හා අදහස් මගේ පෞද්ගලික ඒවා මිස Lineage සමාගමේ ඒවා නොවන බව මා විසින් පැහැදිලි කර ගෙන තිබේ ද?
- මා දේශපාලනික ක්‍රියාකාරකම් හා දායකත්වයන්ට අදාළ නීති සියල්ලටම අනුකූලතාව දක්වන්නේ ද?

මෙම ප්‍රශ්න සඳහා පිළිතුර සෑම විටම “ඔව්” යන්න විය යුතු ය. Lineage සමාගම වෙනුවෙන් කවර හෝ දේශපාලනික දායකත්වයක් සිදු කිරීමට පෙර නීති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමටත්, ඔබට කවර හෝ ගැටලුවක් හෝ ප්‍රශ්නයක් තිබේ නම් ඔබේ Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගැනීමටත් කටයුතු කරන්න.

# අපගේ මිහිතලය ආරක්ෂා කිරීම

අප වසන පෘථිවිය අප සියලු දෙනාට අතිශයින් වටිනා සම්පතකි — Lineage හි අපි අපගේ පොදු පරිසරය වෙනුවෙන් අප සතු වගකීම මනාව වටහා ගෙන සිටින්නෙමු. 'කාලගුණික ප්‍රතිඥාවට' අත්සන් තැබීමද ඇතුළුව බොහෝ ආයතනික ක්‍රියාදාම ඔස්සේ Lineage සමාගම පාරිසරික තිරසාරතාව වෙනුවෙන් නිරතුරුව ඇපකැප වී කටයුතු කරයි - 2040 වන විට අපගේ ගෝලීය මෙහෙයුම් පුරාවටම කාබන් විමෝචනය ශුන්‍ය කිරීමේ ඉලක්කය ජය ගැනීම මෙන්ම පුනර්ජනනීය විකල්ප වෙනුවෙන් අප සිදු කරන සැලකිය යුතු ආයෝජනයන් හරහා එය සාක්ෂාත් කර ගැනීම අපේ අරමුණයි. එහෙත්, තනි පුද්ගලයන් වශයෙන් අප අපගේ කාර්යයන් ඉටු කරන ආකාරය පිළිබඳ සරල හා සුළු තෝරා ගැනීම් - සහ අප කරන කියන දෑ - අපගේ මිහිතලයේ අනාගතය කෙරෙහි සුවිසල් බලපෑමක් එල්ල කරනු සමත් බව වටහා ගත යුතු ය.



## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- අපගේ නිෂ්පාදන හා සේවාවන්හි ආයුචක්‍රය තුළ අපගේ ආයතනික කාර්යාල, ගබඩා පරිශ්‍ර මෙන්ම මහමගදී ද පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන සැලසුම් කර ඇති Lineage ක්‍රමවේද නිරතුරුව අනුගමනය කරන්න.
- අපගේ මෙහෙයුම් සියල්ල පුරාවට අපතේ යාම වැළැක්වීම සඳහා මහා විශාල හා සුළු තීරණ ගන්න.

## එකට සම්බන්ධ කිරීම

### අඩු කරන්න, ආදේශ කරන්න, නිරත වන්න

Lineage හි අපි පාරිසරික තිරසාරතාව වෙනුවෙන් අඩු කිරීම, ආදේශ කිරීම සහ නිරත වීම යන උපාය මාර්ගය අනුගමනය කරන්නෙමු. අප නිසා පරිසරය වෙත කාබන් විමෝචනය වන ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා අප සවිඥානික ප්‍රයත්නයක් දරන අතර ඒ වෙනුවට පිරිසිදු බලශක්ති ප්‍රභව භාවිතය ගනිමින් ආදේශක විකල්ප යොදා ගැනීමට අපි පියවර ගනිමු. අපි අපගේ මිහිතලය එක්ව ආරක්ෂා කිරීමට එක්ව කටයුතු කරන අතරේ පුනර්ජනනීය බලශක්තිය විෂයික අපගේ පිළිවෙත් හා කැපවීම බෙදාහදා ගැනීම තුළින් අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සහ සමස්ථ සමාජය සමඟ වගකීමෙහි නිරත වන්නෙමු.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

### අපද්‍රව්‍ය අඩු කිරීමට පියවර ගැනීම

අප විසින් නිපදවනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම සඳහා අපට අපගේ දෛනික හුරුපුරුදු නැවත ඇගයීමට ලක් කළ හැකි ආකාර බොහොමයක් තිබේ.

**ඔබෙන්ම අසන්න:**

- සත්‍ය වශයෙන්ම මා යම් ලේඛනයක් මුද්‍රණය කිරීම අවශ්‍ය ද, නැතහොත් මට එය ඉලෙක්ට්‍රොනික අනුවාදයක් ලෙස තබා ගත හැකි ද?
- සන්ධ්‍යා කාලයේදී කාර්යාලයෙන් පිටත්ව යන විට මා විදුලි බුබුළු නිවා දමන්නේ ද?
- එක් වරක් පමණක් භාවිත කළ හැකි ප්ලාස්ටික් බෝතලයක් වෙනුවට මට නැවත නැවත භාවිත කළ හැකි බෝතලයක් භාවිත කරන්නට හැකියාව තිබුණේ ද?
- මා මගේ ට්‍රක් රථයේ එංජිම අක්‍රිය තත්ත්වයේ තබනු වෙනුවට එය ක්‍රියා විරහිත කළ යුතු ද?

අපගේ දෛනික පුරුදු සුළු සුළු වෙනස්කම්වලට භාජනය කිරීමෙන් අපගේ මිහිතලය කෙරෙහි දිගු කාලීන බලපෑමක් එල්ල කිරීමට අපට හැක.

# සමාජයීය බලපෑම

Lineage සමාගම අපගේ කණ්ඩායම සහ අපගේ ප්‍රජාවන් වෙනුවෙන් යහපත් දේ කිරීමට කැප වී සිටී. සෑම පුද්ගලයෙකුගේම අයිතිවාසිකම්වලට සහාය දෙමින් ඒවාට ගරු කරන අපි එක්රැස් වීමේ නිදහස, පෞද්ගලිකත්වය, සාමූහික කේවල්කරණය, ආගමනය සහ වැඩ කරන කාල වේලාවන්, වැටුප් හා පැය ගණන් යනාදියට අදාළ සියලුම නීතිවලට අනුකූලතාව දක්වන්නෙමු. මිනිස් ජාවාරම, රැකියා ස්ථානය තුළ වෙනස් කොට සැලකීම සහ බලහත්කාරී, අනිවාර්ය ළමා ශ්‍රමිකත්වය තහනම් කරන සියලුම අදාළ නීති අනුගමනය කිරීමට ද අපි කටයුතු කරන්නෙමු.




## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- සෑම පුද්ගලයෙකුගේම සුරක්ෂිතතාව, සෞඛ්‍යය හා වැඩ කොන්දේසි සඳහා ප්‍රමුඛතාව ලබා දීමට අප දක්වන කැපවීම පිළි ගන්නා ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ වැඩ කිරීමට තෝරා ගන්න.
- වේතන හා වැඩ කරන පැය ගණන්වලට අදාළ නීති සහ බලහත්කාරී, ජාවාරම්කාරී හෝ ළමා ශ්‍රමිකත්වය යනාදිය තහනම් කිරීම ඇතුළත් සාධාරණ කම්කරු නීතිවලට ගරු කරන්න.

## එකට සම්බන්ධ කිරීම

### නූතන වහල් සේවය යනු කුමක් ද?

'නූතන වහල් සේවය' යනු බලහත්කාරය, බලපෑම් කිරීම, අපයෝජනය හෝ රැවටීම හෝ පුද්ගලික හෝ වාණිජමය ලාභ උපයනු පිණිස වෙනත් ආකාරවලින් සූරාකෑමට ලක් කිරීම තුළින් මිනිසුන් රැකියාවල යෙදවීම, වෙනත් තැන්වලට රැගෙන යාම, රඳවා තබා ගැනීම හෝ ලබා ගැනීම විස්තර කරනු පිණිස වැඩි වැඩියෙන් භාවිත වෙමින් පවතින පදයකි. Lineage හි අප කිසිසේත්ම නූතන වහල් සේවය නොඉවසන අතර, අපගේ සැපයුම් දාම හා මෙහෙයුම් ආශ්‍රිතව නූතන වහල් සේවා ලක්ෂණ බිහි වීමේ අවදානම අවම කිරීම සඳහා අපගේ පිළිවෙත් සංවර්ධනය කිරීමට අපි නිරතුරුව කැප වී සිටින්නෙමු.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

### නූතන වහල් සේවය

නූතන වහල් සේවය වැළැක්වීමට සහාය වීමේ වගකීම අප සියලුම දෙනා වෙත පැවරෙන්නකි. එසේ කිරීම සඳහා අපට මෙම ප්‍රශ්න අපෙන් ඇසිය හැක:

- අප නූතන වහල් සේවයේ සලකුණු පිළිබඳව අවධානයෙන් පසු වන්නේ ද? එම සලකුණු, කිසියම් ස්ථානයක සත්‍ය වශයෙන්ම වැඩ කළ යුතු අයට වඩා අඩු වයසින් යුතු සේවකයන් සේවයේ යොදවා ඇති අවස්ථාවල මෙන් ඉතා ප්‍රත්‍යක්ෂ ලෙස පෙනෙන ඒවා මෙන්ම, වෙනත් කිසිවෙකු සමඟ සේවකයන් සම්බන්ධතා පැවැත්වීමට පැකිළෙන හෝ මන්ද පෝෂණයෙන් පෙළෙන, බියට පත් වූ හෝ සමාජ සබඳතාවලින් ඉවත් වූ බවක් පෙන්නුම් කෙරෙන අවස්ථාවල මෙන් ඉතාම සියුම් සලකුණු ද විය හැක.
- අපගේ කවර හෝ ව්‍යාපාරික හවුල්කරුවෙකු අසාධාරණ තරමින් අඩු ගෙවීම්, නිවාඩු නොමැති වීම්, අනාරක්ෂිත තත්ත්ව හෝ ඉතා දුර්වල නිවාස පහසුකම් තිබීම වැනි මනුෂ්‍යත්වයට නොගැලපෙන සහ පිළිගත නොහැකි තත්ත්වයන්ට මුහුණ පා ඇති බවට ගැටලු මතු වේ නම් අපි ඒ පිළිබඳව හඬ අවදි කරන්නෙමු ද?

මෙම ප්‍රශ්නවලට පිළිතුර සෑම විටම "ඔව්" යන්න විය යුතු ය. ධෛර්යමත් වීමෙන් හා සේවක නායකත්වය පිළිබිඹු කිරීමෙන් අප අපගේ වටිනාකම් තුළ ජීවත් වන්නේ එලෙස හඬ නැගීමෙනි. නූතන වහල් සේවයට හෝ වෙනත් සමාජ හෝ පාරිසරික අර්බුදයක් සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් ඔබට තිබේ නම්, වහාම ඒ බව ඔබගේ Speak Up සම්පත් පුද්ගලයන් වෙත වාර්තා කරන්න.

# ප්‍රජා සේවාව සහ ප්‍රජා සත්කාර ලබා දීම

Lineage සමාගම අප ජීවත් වන ප්‍රජාවන් ආශ්‍රිත ධනාත්මක බලපෑමක් ඇති කරනු පිණිස විවිධ පරාර්ථකාමී ක්‍රියාදාම රැසකට සහාය දක්වන අතර ලෝකය පුරාවටම ක්‍රියාත්මක වෙමින් අපගේ ප්‍රජාවන් තුළ වෙනසක් උදා කිරීම උදෙසා සත්කාර ලබා දෙන ලෙස අපගේ කණ්ඩායම් සාමාජිකයන් සවිගැන්වීම සිදු කරයි. Lineage විසින් ලබා දෙනු ලබන ඕනෑම පරිත්‍යාගයක්, අනුග්‍රාහකත්වයක් හෝ ස්වේච්ඡා සේවාවන් සඳහා ලබා දෙන සහභාගීත්වයක් අදාළ නීති, මෙම චර්යා ධර්ම සංග්‍රහය සහ Lineage මෙහෙයුම් මාර්ගෝපදේශනවලට අනුකූලව සිදු කළ යුතු වේ.




## කණ්ඩායම් සාමාජිකයන් සතු වගකීම්:

- **පූර්ව අනුමැතිය ලබා දී ඇති ප්‍රජා සේවා ක්‍රියාකාරකම් සඳහා ස්වේච්ඡා සහභාගීත්වය ලබා දීම සඳහා කාලය ලබා ගැනීමට සේවයෙන් බැහැරව සිටින කාල සඳහා ගෙවීම් ඉල්ලා සිටීමට හා ලබා ගැනීමට ඔබට ඉඩකඩ ලබා දෙන Time for Good වැඩසටහනේ වාසිය ලබා ගන්න.**
- **කාලය, විවිධ ද්‍රව්‍ය හෝ මුදල් ලබා දීම හෝ කිසියම් සිදුවීමක් සඳහා අනුග්‍රාහකත්වය ලබා දීම සඳහා Lineage හි සහාය පතමින් ඔබ වෙත ඉල්ලීමක් ලැබෙන්නේ නම් Lineage Foundation for Good සම්බන්ධ කර ගන්න.**

## එකට සම්බන්ධ කිරීම

### පරිත්‍යාග

පරිත්‍යාගයන් මූල්‍යමය පරිත්‍යාගවලට පමණක් සීමා නොවේ. ඒවා පහත පරිදි විය හැක:

- **කාලය පරිත්‍යාග කිරීම**
- **ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම**
- **මුදල් පරිත්‍යාග කිරීම**

Lineage විසින් ඕනෑම ආකාරයක පරිත්‍යාගයක් සිදු කරන ලෙස ඉල්ලීමක් ඔබ වෙත ලැබුණහොත් Lineage Foundation for Good සම්බන්ධ කර ගැනීමට අමතක නොකරන්න. පරිත්‍යාග සිදු කිරීමේදී අදාළ නීති සහ Lineage ප්‍රතිපත්තිවලට අනුකූලතාව දැක්වීම වැදගත් වේ.

## උෂ්ණත්වය පරීක්ෂා කිරීම

ඔබ Lineage වෙනුවෙන් ස්වේච්ඡා සේවා ලබා දෙන විට, පහත ප්‍රශ්න ඔබෙන් අසන්න:

- **ප්‍රජාව තුළ ස්වේච්ඡා සේවා සැපයීමේදී මා අපගේ සේවක නායකත්වය පිළිබඳ වටිනාකමට ආදර්ශයක් ලබා දෙන්නේ ද?**
- **ස්වේච්ඡා සේවා ලබා දීම වෙනුවෙන් ප්‍රතිලාභය ලබා ගැනීමේදී මා Time for Good ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ ද?**
- **මගේ ප්‍රජා සේවාවන්හිදී මා කණ්ඩායම් සාමාජිකයන්, ස්වේච්ඡා සේවකයන් සහ ප්‍රජා සාමාජිකයන් හට ගෞරවයෙන්, අවංකභාවයෙන් හා අභිමානවත් ලෙස සලකන්නේ ද?**

ප්‍රජා සේවාවන්හි ඔබේ සහභාගීත්වය හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවක් ඔබට තිබේ නම් ඔබේ Speak Up සම්පත් පුද්ගලයෙකු හා සම්බන්ධ වීමට අමතක නොකරන්න.




# සාරාංශය

# සාරාංශය

දාමය සවිමත් කිරීම සඳහා අප සියලුම දෙනා සේවයට පැමිණෙන සෑම දිනකම උෂ්ණත්ව පාලිත නිෂ්පාදන දාමය වැඩිදියුණු කිරීම උදෙසා අප විසින් ඉටු කළ යුතු කාර්යය කිරීම අවශ්‍ය වේ. නිරතුරුවම ඒකාබද්ධතාවෙන් යුතුව හා අප සියලුම දෙනාට පොදු සමාගමික වටිනාකම්වලට අනුකූලතාව දැක්වීම තුළින් අපි එය ඉටු කරන්නෙමු. මෙම චර්යා ධර්ම සංග්‍රහය කියවීම එහි ආරම්භක පියවර පමණි. ආචාර ධාර්මික තීරණ ගැනීම උදෙසා සහ එකම Lineage කණ්ඩායමක් වශයෙන් අප සතු අනන්‍යතාවට අනුකූලව කටයුතු කිරීම සඳහා මූලාශ්‍රයක් වශයෙන් සෑම දෙනාම සිය දෛනික ජීවිතවලදී මෙම සංග්‍රහය පරිහරණය කරන ලෙස අපි දිරිමත් කරමු.

ඔබට ප්‍රශ්න හෝ ගැටලු මතු වන ඕනෑම අවස්ථාවක හෝ හුදෙක්ම කිසිවෙකු සමඟ යම් ගැටලුවක් පිළිබඳව කතා කිරීමට අවශ්‍ය මොහොතක ඔබ වෙනුවෙන් Speak Up සම්පත් පුද්ගලයන් සිටින බව සිහි තබා ගන්න. හඬ අවදි කිරීම මඟින් අපගේ අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කෙරෙන අතර, අවස්ථා මනාව වටහා ගනිමින් ඔබ මුහුණ පාන ගැටලුවලට විසඳුම් සොයා ගැනීම තුළින් අපගේ කණ්ඩායම වඩා සවිමත් කිරීමට එය ඉවහල් වේ. එසේම, ඔබේ ගැටලු ආමන්ත්‍රණය කරමින් කල්තියාම ඒවා විසඳීමට මෙන්ම Lineage සමාගමට ඇති අවදානම් අඩු කිරීමටත් එය මහෝපකාරී වේ.

## ප්‍ශ්නයක් අසන හෝ ගැටලුවක් වාර්තා කරන ආකරය

ඔබට පුශ්න කිසිවක් ඇසීමට තිබේ නම් හෝ විෂමාචාරයක් හෝ සිදු විය හැකි දුරාචාරයක් පිළිබඳව වාර්තා කිරීමට අවශ්‍ය නම්, පහත දැක්වෙන ඕනෑම Speak Up සම්පත් පුද්ගලයෙකු සම්බන්ධ කර ගන්න:

- **ඔබේ කළමනාකරු හෝ වැඩ පරීක්ෂක**
- **මානව සම්පත් කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු**
- **ආයතනික අනුකූලතා සහ ආචාර ධර්ම කණ්ඩායම (ethics@onelineage.com)**
- **Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව (onelineage.com/speakup)**

අපගේ Speak Up සම්පත් පුද්ගලයන් සමඟ සිදු කෙරෙන සන්නිවේදනයන් සියල්ලම දේශීය නීති සහ අදාළ වන අනෙකුත් දේශීය ප්‍රතිපත්තිවලට අනුකූලව හසුරුවනු ලැබේ (උදා:- අදාළ ඕනෑම දුක්ගැනවිල්ලක්, පැමිණිල්ලක් හෝ අදාළ වන නෛතික සීමාව තුළ විසිල්බ්ලෝවිං ප්‍රතිපත්තියක් ආදී).

## Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව

ප්‍රශ්න හෝ ගැටලු සම්බන්ධයෙන් ඔබගේ කළමනාකරු හෝ වැඩ පරීක්ෂක වෙත යොමු වීමේදී ඔබට පහසුදායී හැඟීමක් දැනීමට සැලැස්වීම අපගේ අවශ්‍යතාවයි. එසේම, ඔබ වෙනත් විකල්පයක් කරා යොමු වීමට කැමැත්තක් දක්වන අවස්ථා ද තිබිය හැකි බව අපි වටහා ගනිමු. විෂමාචාර හෝ සිදු විය හැකි කවර හෝ දුරාචාරයක් සම්බන්ධයෙන් ගැටලු වාර්තා කිරීමේදී හෝ ප්‍රශ්න මතු කිරීමේදී ඔබට සහාය වනු පිණිස අපි තුන්වැනි පාර්ශ්වයක් විසින් සත්කාරකත්වය ලබා දෙනු ලැබෙන Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව පිහිටුවීමු.

Lineage ආචාර ධර්ම ක්ෂණික ඇමතුම් සේවාව සතියේ දින 7 පැය 24 පුරාවටම විවෘතව පවතින අතර එහිදී රහස්‍යභාවය සුරැකෙන අතර දේශීය නීති මඟින් අවසර ලැබෙන

අවස්ථාවලදී නිර්ණාමිකව ක්‍රියාත්මක වේ. පහත නාලිකා ඔස්සේ වාර්තා යොමු කළ හැක:

- **දුරකතනය ඔස්සේ:**
  ඕස්ට්‍රේලියාව - 1-800-768-120
  බෙල්ජියම - 0800-262-67
  කැනඩාව - 866-360-0008
  ඩෙන්මාර්කය - 80 25 42 15
  ප්‍රංශය - 0805-080039
  ජර්මනිය - 0800-183-0724
  ඉතාලිය - 800 743 075
  නෙදර්ලන්තය - 0800- 023-3064
  නවසීලන්තය - 0800 823 509
  නෝර්වේ - 800 62 472
  පෝලන්තය - 0-0-800-141-0023
  සිංගප්පූරුව - 8004922583
  දකුණු අප්‍රිකාව - 080 098 2093
  ශ්‍රී ලංකාව - 9-072-0987140
  ස්පාඤ්ඤය - 900-963267
  එක්සත් රාජධානිය - 0-808-189-0041
  ඇමරිකා එක්සත් ජනපදය -
  866-360-0008 (ඉංග්‍රීසි) හෝ
  800-216-1288 (එස්පැනෝල්)
  වියට්නාමය 120-32121

- **අන්තර්ජාලය හරහා:** අන්තර්ජාලය ඔස්සේ වාර්තාවක් යොමු කිරීමට පිවිසෙන්න www.lighthouse-services.com/lineagelogistics

- **විද්‍යුත් තැපෑල ඔස්සේ:** ඔබේ සමාගමේ නම සඳහන් කොට reports@lighthouseservices.com, වෙත විද්‍යුත් තැපැල් පණිවිඩයක් එවන්න.

Lineage හි අප, අපගේ කණ්ඩායම් සාමාජිකයන් ප්‍රශ්න මතු කිරීම පදනම් කර ගෙන ඔවුන් කිසිදු ආකාරයක පළිගැනීමකට ලක් වන්නේ නම් එය කිසිදු ලෙසකින් නොඉවසන අතර ගැටලු මතු විය හැකි සිදු වීම් සම්බන්ධයෙන් යහපත් චේතනාවෙන් සිය හඬ අවදි කරන ඕනෑම අයෙකු හට සහාය දැක්වීමට අපි කැප වී සිටින්නෙමු. **අපි එක්ව දමය සවිමත් කරමු.**